# චිත්‍ර කලාව

## 8 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2017 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# චිත්‍ර කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 8 ශ්‍රේණිය

**(2017 සිට ක්‍රියාත්මක වේ.)**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk
info@ni.lk

**චිත්‍ර කලාව**

**8 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2016**

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

*මුද්‍රණය* : ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි, යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද, සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව, ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ආයතනය විසින් දේශයේ සමස්ත දරු කැල වෙනුවෙන් පාසල් පද්ධතිය වෙත 2015 සිට නිර්දේශ කරන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි දෙවන පියවර 2016 දී හා තෙවන පියවර 2017 දී ක්‍රියාවට නැංවේ. ඒ අනුව 2017 වසරේ 8 ශ්‍රේණිය සඳහා වූ නව විෂය නිර්දේශය නව්‍යකරණයන් සහිත ව හඳුන්වා දෙමින්, එහි ක්‍රියාත්මක භූමිකාව රඟන ගුරුවරයාට නිසි මඟපෙන්වීම් ලබා දීම පිණිස මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කොට ඇත.

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව වසර 8කට වරක් එළැඹෙන මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මඟින් ජාතික අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා පාසල් පද්ධතියට ඒ ඒ විෂයයන් සඳහා නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ශිල්ප, සංකල්ප හඳුන්වා දෙනු ලබන අතර, සෞන්දර්ය විෂයයන්හි මෙතෙක් නිර්දේශිත ගී, කවි, කතා, සංස්කෘතික කරුණු, තේමා, සම්ප්‍රදායයන්හි විවිධත්ව, ඈ සමකාලීන අවශ්‍යතා මත නව දේශීය දර්ශනයට අනුකූල ව අනාගතයට ගැළපෙන පරිදි ඉදිරිපත් කර ඇත.

අප විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී පළමු කොට ම හඳුනා ගන්නා ලද 6-13 දක්වා පුළුල් වූ විෂය සන්ධාරය (Curriculum Grid) නිපුණතා හා නිපුණතා මට්ටම් ලෙස දරුවාගේ වර්ධන හා චින්තන අවධීන්ට අනුව ක්‍රමික ව පෙළගස්වා ඇත. ඒ අනුව 6,7,10 හා 11 ශ්‍රේණි සඳහා නිර්දේශිත විෂය කරුණු සමඟ අවියෝජනීය සබඳතාවක් ඇතිවන පරිදි මෙන් ම ක්‍රමික වර්ධනයක් ද සිදු වන පරිදි 8 ශ්‍රේණිය විෂය නිර්දේශය සැලසුම් කොට ඊට අනුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශය රචනා කොට ඇත.

විෂය නිර්දේශයන්හි නාමික ව දක්වා ඇති විෂය කරුණුවල සීමා නිර්ණයන් නිවැරැදි ව තෝරා බේරා ගැනීම, දරුවා තුළ සංකල්ප සාධනයෙහි ලා විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ හඳුනා ගැනීම, පාඩම දරුවාට පිළිගැන්වීමෙහි ලා යෝජිත සුවිශේෂ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම යන ශක්‍යතා මෙම ගුරු මාර්ගෝපදේශය මඟින් ප්‍රමාණාත්මක ව ගුරු ඔබ වෙත ලැබෙනු ඇත.

අප විෂයමාලා කමිටුව විසින් රචිත මෙම පොත පරිහරණය කරමින් ඔබ, විෂය කරුණුවල අවශ්‍ය මූලික දැනුම අත්පත් කර ගත්ත ද, යෝජිත විෂය කරුණුවල සමාජ භාවිතාව පිළිබඳ ව ඔබගේ මනා සැලකිලිමත් බව වැදගත් ය. ඒ සඳහා, විෂය භේදයකින් තොර ව සංගීත කෘතිවලට සවන් දීම, නර්තන, නාට්‍ය ප්‍රසංග හා චිත්‍රපට නැරඹීම, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම ආදිය ඉතා හොඳ ප්‍රබෝධමත් බවක් හා පෙලඹවීමක් ඔබ තුළ ජනිත කරනු ඇත.

ඒ අනුව ගුරු මාර්ගෝපදේශය ද, උදවු අත්පොත ද ඒවායේ ඇතුළත් පණිවිඩ, හැඳින්වීම් ආදි සියල්ල සහිත ව පූර්ණ වශයෙන් ම කියවන්න. ඉන් ගුරුවරයකු ලෙස ඔබ සතු විය යුතු අත්‍යවශ්‍ය ගුණයක් වූ ''කියවීමේ පුරුද්ද'' ඔබට ලැබ ගන්නට හැකි වනු ඇත.

මේ සියලු ව්‍යායාමයන්හි, කර්තව්‍යයන්හි අග්‍ර ඵලය අපගේ දරු පරපුර වෙත ලබා දෙන්නට ඔබගේ ගුරු භූමිකාව ශක්තිමත් වේවා! යන්න මාගේ ඒකායන පැතුම යි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය),
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | එම්.ජී.ඒ.කේ.යූ.බණ්ඩාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | : | ඥානසිරි බී.ගමගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**විෂය විශේෂඥ උපදෙස්**

| | | |
|---|---|---|
| මහාචාර්ය රම්‍යවර්ධන පොඩිනිලමේ | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ටී. සනාතනන් | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඥානසිරි බී. ගමගේ මයා | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| රවීන්ද්‍ර තේනුවර මයා | : | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| චමරි තපස්වරගේ මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| මනෝරා ප්‍රේමතිලක මිය | : | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය**

| | | |
|---|---|---|
| ආචාර්ය උපාලි රංජිත් රණවක | : | කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, බුලත්සිංහල |
| ශ්‍රීමති ඒකනායක මිය | : | කථිකාචාර්ය (බාහිර), කැලණිය විශ්වවිද්‍යාලය |
| එල්. එස්. වෛහැල්ල මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |
| එස්. ඒ. හර්ෂා මනෝජනී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම |
| එච්. ඒ සංජීවි මංජරී මිය | : | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |
| එච්. එම්. එස්. පි. එච්. බණ්ඩාර මයා | : | චිත්‍ර කලා ආචාර්ය, ශාන්ත සිල්වෙස්තර විද්‍යාලය, මහනුවර |
| එම් ආර්. ජෙබරාජ් මිය | : | චිත්‍ර කලා ආචාර්ය, හින්දු කාන්තා විදුහල, යාපනය |
| එස්. මනෝකරන් මයා | : | චිත්‍ර කලා ආචාර්ය, විපුලානන්ද විදුහල, වවුනියාව |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | ශ්‍රීනාත් ගණේවත්ත මයා, භාෂා සංස්කාරක<br>මනෝරා ප්‍රේමතිලක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පිටකවර නිර්මාණය** | : | රවීන්ද්‍ර තේනුවර මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **පරිගණක යතුරු ලියනය** | : | මනෝරා ප්‍රේමතිලක මිය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |
| **විවිධ සහාය** | : | දීපා ශිරෝමණි මෙය, සෞන්දර්ය අධ්‍යාපන දෙපා.<br>ප්‍රේමරත්න පෙරේරා මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපා. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, වර්ෂ 2017 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත චිත්‍ර කලාව 8 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇත. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත් කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ කාලය කළමනාකරණය කරගන්න.

- ප්‍රධාන නිපුණතා 07ක් යටතේ පෙළගස්වා ඇති අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 දක්වා වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත් මාතෘකා පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න.

- 6.0 හා 7.0 නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ඇතත්, සුදුසු නිර්මාණශීලී ක්‍රමවේද භාවිත කර, අදාළ විෂය කරුණු සාක්ෂාත් වන සේ ක්‍රියාකාරකම් වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත.

- යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

  I සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානික රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාගෙන සිසුන් පාඩමට ඇදබැඳ ගැනීම හා පෙර දැනුම විමසීමට පොලඹවා ගැනීම ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසිය යුතු ය.

  II සිසුන්ගේ ශක්‍යතා හඳුනා ගෙන නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙනයෑමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා විය හැකි ය.

  III ඉදිරිපත් කිරීම්, ඇගයීම්, සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- ගුරු මාර්ගෝපදේශය මගපෙන්වීමක් පමණි. විෂයබද්ධ ග්‍රන්ථ, අන්තර්ජාලය, වැනි මාධ්‍ය පරිශිලනය කිරීමෙන් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- හඳුන්වා දී ඇති සියලු ම නිපුණතා පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනගා ඇති බැවින්, එම නිපුණතා 07 ම අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

  පහත වගුව අනුව ක්‍රියාකාරකම් වාර තුනට බෙදාගත හැකි ය.

| 1 වාරය | 2 වාරය | 3 වාරය |
|---|---|---|
| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම් අංකය |
| 1.1.1 1.1.2 1.2.1 2.1.1 | 1.2.2 1.2.3 1.3.1 2.2.1 | 1.2.4 1.2.5 |
| 2.1.2 3.1.1 3.1.2 4.1.1 | 3.2.1 3.3.1 3.3.2 4.1.2 | 1.2.6 2.2.2 |
| 5.1.1 6.1.1 7.1.1 | 4.2.1 5.1.2 5.2.1 6.2.1 | 3.4.1 3.4.2 |
| | 7.2.1 7.3.1 | 4.1.3 5.3.1 |
| | | 6.3.1 |
| | | 7.4.1 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| හැඳින්වීම | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශය | ix-xxiv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-68 |

# විෂය නිර්දේශය

# හැඳින්වීම

පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක සමස්ත විෂයමාලාවෙන් "චිත්‍ර කලාව" විෂය වනාහී සුවිශේෂ වූවකි. නිර්මාණකරණයට හා වින්දනයට ප්‍රමුඛස්ථානයක් හිමි වන චිත්‍ර කලාව විෂයයෙන් සිදුවන්නා වූ සමාජ මෙහෙවර ඉතා වැදගත් ය. චිත්‍ර කලාවෙන් පුද්ගලයාගේ සුසමාහිත පෞරුෂය සංවර්ධනය වෙයි.

චිත්‍ර කලාව විෂය නිර්දේශයේ, විෂය බද්ධ නිපුණතා හතකින් දරුවා තුළ දැනුම, ආකල්ප, කුසලතා හා යහපත් ජීවන පුරුදු වර්ධනය කර ගැනීමෙහි ලා අවධානය යොමු කර ඇත. විෂය බද්ධ නිපුණතාවල දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනුවෙන් නිපුණතා පහක් ද රසාස්වාදය හා කලා ඉතිහාසය අධ්‍යයනය සඳහා නිපුණතා දෙකක් ද වෙන් කර ඇත. ඒ අනුව එක් එක් ශ්‍රේණියේ වයස් මට්ටමට ගැළපෙන සේ විෂය අන්තර්ගතය, නිපුණතා මට්ටම් ඔස්සේ පෙළ ගස්වා ඇත.

විෂය නිර්දේශ සංස්කරණයේ දී පහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

- ජාත්‍යන්තර චිත්‍ර කලාවේ නව ප්‍රවණතා
- ක්ෂේත්‍රයෙන් ප්‍රකාශිත නවමු අදහස්
- පාසල් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ කරන ලද නිරීක්ෂණ හා සමීක්ෂණ

පළමුවන නිපුණතාව යටතේ වන මිනිස් රූප හා සත්ත්ව රූප ඇඳීම සඳහා වන මූලික අභ්‍යාස සඳහා නව නිපුණතා මට්ටම් සකස් විය. දෙවන නිපුණතාව යටතේ වන ස්වභාවික හා නිර්මිත පරිසරයේ මූලික හැඩතල හා හැඩ සඳහා නිපුණතා මට්ටම් ද, නව තාක්ෂණය හා වැඩ ලෝකයට ඇවැසි දැනුම හා කුසලතා සාධනය වන ලෙසින් තුන්වන හා හතරවන නිපුණතාවන්ට අදාළ නිපුණතා මට්ටම් ද සකස් විය. ආකෘති නිර්මාණයෙන් ත්‍රිමාන බව පිළිබඳ සංකල්පය තවදුරටත් පසක් කරනු වස්, පස්වන නිපුණතාව යටතේ නිපුණතා මට්ටම් සකසා ඇත. රසාස්වාදය හා කලා ඉතිහාසය පිළිබඳ දැනුම ලැබීම මෙන් ම විවිධ කෘතීන් අධ්‍යයනයෙන් ලත් දැනුම භාවිතයට ගැනීමට අවස්ථාව සැලසීම හයවන හා හත්වන නිපුණතාවන්හි නිපුණතා මට්ටම්වලින් සාධනය කිරීමට අපේක්ෂිත ය.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර, ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයක් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |

| | | |
|---|---|---|
| ජෛව පරිසරය | : | සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ. |

**(IV)** **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



**(V)** **ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI)** **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII)** **"ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## චිත්‍ර කලා කලා විෂය අරමුණු

1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය.

2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය.

3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය.

4. දේශීය හා විදේශීය සංස්කෘතික අංගයන්ගේ අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම.

5. විචාර ශක්තිය වර්ධනය.

6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවන්ගෙන් සමන්විත සමබර පෞරුෂ වර්ධනය.

## 5.0 ජාතික පොදු අරමුණු සහ චිත්‍ර කලා විෂය අරමුණු අතර සම්බන්ධතා දැක්වීම

| ජාතික පොදු අරමුණු | චිත්‍ර කලා විෂය අරමුණු |
|---|---|
| I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම | 4. දේශීය හා විදේශීය කලාවල අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම |
| II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම | 4. දේශීය හා විදේශීය කලාවල අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම<br>6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය |
| III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම | 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය<br>2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය<br>3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය |
| IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම | 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය<br>3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය |

| ජාතික පොදු අරමුණු | චිත්‍ර කලා විෂය අරමුණු |
|---|---|
| V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම | 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය<br>2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය<br>3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය<br>5. විචාර ශක්තිය වර්ධනය<br>6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය |
| VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම | 3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය |
| VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම | 5. විචාර ශක්තිය වර්ධනය<br>6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය |
| VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම | 3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය<br>4. දේශීය හා විදේශීය කලාවල අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. | 1.1 මානව හා සත්ත්ව රූප අධ්‍යයනය කර චිත්‍ර ඇඳ වර්ණ කරයි. | ■ වර්ණ චිත්‍ර<br>• මානව හා සත්ත්ව ඉරියව්වු අධ්‍යයනය<br>- මානව ඉරියව්වු<br>- සත්ත්ව ඉරියව්වු<br>• වර්ණ භාවිතය<br>- ද්විමාන හා ත්‍රිමාණ ලක්ෂණ<br>- සමස්ත නිමාව | • මානව හා සත්ත්ව ඉරියව්වු ඇඳ වර්ණ කරයි. | 20 |
| | 1.2 ස්වාභාවික හා නිර්මිත පරිසරය ආශ්‍රිත චිත්‍ර සංරචනය කරයි. | ■ සංරචන මූලිකාංග<br>• රේඛා<br>• හැඩතල<br>• වර්ණ භාවිතය<br>• තලය භාවිතය<br>■ චිත්‍ර සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• ත්‍රිමාණ හා ද්විමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• ප්‍රකාශනය<br>• නිමාව | • පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි. | |
| | 1.3 විවිධ ශෛලිගත කලා ලක්ෂණ ආශ්‍රිත චිත්‍ර සංරචනය කරයි. | ■ චිත්‍ර සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය හා පරිමාව<br>• ද්විමාන ලක්ෂණ<br>• සමබරතාව<br>• ප්‍රකාශනය<br>• නිර්මාණශීලී නිමාව<br>- රේඛා භාවිතය හා සැරසිලි අංග භාවිතය | • විවිධ ශෛලිගත කලා ලක්ෂණ ඇසුරෙන් චිත්‍ර නිර්මාණයේ යෙදෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පරිසරයේ පවත්නා වස්තූන් සම්පිණ්ඩ-නාත්මක ව චිත්‍රණය | 2.1 පරිසරයේ ඇති ස්වාභාවික හා නිර්මිත හැඩ රේඛාවෙන් අධ්‍යයනය කරයි. | ■ රේඛා චිත්‍ර සම්පිණ්ඩනය<br>• ස්වාභාවික හැඩ<br>• නිර්මිත හැඩ<br>• විවිධ මාධ්‍ය භාවිතය<br>- පැන්සල්<br>- පැස්ටල්<br>-චාකෝල්<br>• රේඛාවේ විවිධතා | • පරිසරයේ ඇති ස්වාභාවික හා නිර්මිත හැඩ රේඛා භාවිතයෙන් සම්පිණ්ඩනය කරයි. | 08 |
| | 2.2 පරිසරයේ ඇති ස්වාභාවික හා නිර්මිත හැඩ සම්පිණ්ඩන ඇඳ, වර්ණ ගන්වයි. | ■ සම්පිණ්ඩනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිතය<br>• පරිමාණය<br>• ත්‍රිමාණ ලක්ෂණ<br>• එළිය අඳුර<br>• පර්යාලෝකය<br>• සමබරතාව<br>• නිමාව<br>■ විවිධ වර්ණ භාවිතය<br>- වයනය (මතුපිට පෘෂ්ටීමය ස්වභාවය)<br>- එළිය අඳුර හා ත්‍රිමාණ ලක්ෂණ<br>• පැස්ටල්<br>• දියසායම්<br>■ තලය භාවිතය<br>■ ස්වාභාවික, සරල ජ්‍යාමිතික හා නිර්මිත හැඩ සම්පිණ්ඩනය<br>- ශාක කොටස්<br>- ජ්‍යාමිතික හැඩ | • විවිධ ශාක කොටස්වල ගති ලක්ෂණ මතු වන සේ පැන්සල භාවිතයෙන් අඳියි.<br>• එළිය අඳුර, ත්‍රිමාණ ලක්ෂණ, පරිමාණය, වයනය හා තලය භාවිතය ද්‍රව්‍ය බලා ඇඳීමේ චිත්‍ර සඳහා විධිමත් ව යොදා ගනී. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 පාරිහාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි. | 3.1 නිර්ජීවී හා දිව්‍ය ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඇසුරෙන් වාටි සැරසිලි නිර්මාණය කරයි. | ■ නිර්ජීවී හා දිව්‍ය ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි<br>• සූර්ය (ඉර) • චන්ද්‍ර (හඳ)<br>• අරිම්බුව • ගල්බිංදුව<br>• පලාපෙති • පනාව • සුළිය<br>■ ජ්‍යාමිතික උපකරණ භාවිතය<br>■ වාටි සැරසිලි<br>• සාරි වාටි<br>• සරොම් වාටි | • නිර්ජීවී හා දිව්‍ය ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි පිළිබඳ අවබෝධයෙන් වාටි සැරසිලි නිර්මාණය කරයි. | 16 |
| | 3.2 වර්ණවත් ශාක පත්‍රයක හැඩය හා වර්ණ සංකලනය අධ්‍යයනය කර සැරසිලි සඳහා භාවිත කරයි. | ■ වර්ණවත් ශාක පත්‍ර<br>• මූලික හැඩය<br>• වර්ණ සංකලනය<br>■ ව්‍යාප්ත සැරසිලි නිර්මාණය<br>• රෙදි සැරසිලි<br>■ ජ්‍යාමිතික උපකරණ භාවිතය | • ස්වාභාවික ද්‍රව්‍යයන්හි හැඩ හා වර්ණ හඳුනාගෙන නිර්මාණ සඳහා භාවිත කරයි. | |
| | 3.3 මුළුතල සැරසිලි නිර්මාණය කරයි. | ■ සැරසිලි නිර්මාණ සිද්ධාන්ත<br>• රිද්මය<br>• සමබරතාව<br>• ඒකත්වය<br>■ ජ්‍යාමිතික උපකරණ භාවිතය<br>■ පාරිහාරික අවශ්‍යතා<br>• සාරි පල්ලු<br>• කුශන් කවර | • අලංකරණ අවශ්‍යතා සඳහා මුළුතල සැරසිලි භාවිත කරයි. | |
| | 3.4 ස්වාභාවික හා නිර්මිත හැඩ අධ්‍යයනය කර පාරිහාරික භාණ්ඩ නිර්මාණය කරයි. | ■ පාරිහාරික භාණ්ඩ නිර්මාණ සිද්ධාන්ත<br>• රිද්මය<br>• සමබරතාව<br>• ඒකත්වය | • පරිසර අධ්‍යයනයෙන් ලබා ගත් සංකල්ප භාවිතයෙන් නිර්මාණකරණයේ යෙදෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ■ පාරිභාරික භාණ්ඩ නිර්මාණය<br>• ස්වාභාවික හා නිර්මිත හැඩ භාවිතය<br>- අවශ්‍යතාවට උචිත හැඩ<br>• දළ සටහන්<br>• සැලසුම හා සැරසිලි චිත්‍ර<br>• උචිත වර්ණ භාවිතය<br>• උචිත භාණ්ඩ හා සැරසිලි නිර්මාණය<br>- අලංකාරයට තබන බඳුනක්<br>- පෑන් පැන්සල් රඳවනය<br>■ ජ්‍යාමිතික උපකරණ භාවිතය | | |
| 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි. | 4.1 අක්ෂරකරණයේ සිද්ධාන්ත භාවිතයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි අක්ෂර නිර්මාණය කරයි. | ■ විවිධ භාෂාවන්ට අයත් අක්ෂර<br>• සිංහල/දෙමළ/ඉංග්‍රීසි අක්ෂර<br>■ සිද්ධාන්ත භාවිතය<br>• ඒකත්වය<br>• රිද්මය<br>• සමබරතාව<br>• නිර්මාණාත්මක අක්ෂර<br>■ වර්ණ භාවිතය<br>• ද්විමාන ලක්ෂණ<br>• ත්‍රිමාන ලක්ෂණ<br>■ ජ්‍යාමිතික උපකරණ හා ශිල්පක්‍රම | • විවිධ භාෂා මාධ්‍ය උපයෝගි කර ගනිමින් නිර්මාණාත්මක අක්ෂරකරණයේ කුසලතාව ලබයි.<br>• නිර්මාණාත්මක අක්ෂර හා රූප සටහන් භාවිතයෙන් ග්‍රැෆික් නිර්මාණ කිරීමේ කුසලතාව ලබයි. | 10 |
| | 4.2 සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි. | ■ සන්නිදර්ශන චිත්‍ර සිද්ධාන්ත<br>• සරල රූප සටහන්<br>• අවශ්‍යතාවට උචිත බව<br>■ සන්නිදර්ශන චිත්‍ර<br>• ළමා ගීතයක්<br>• ළමා කතන්දරයක<br>■ කළු සුදු හා වර්ණ භාවිතය<br>• ද්විමාන ලක්ෂණ<br>• ත්‍රිමාන ලක්ෂණ | • ළමා ගීතයක් හෝ ළමා කතන්දරයක අදහස ගම්‍ය වන සේ සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි. | 5.1 ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිත කර නිර්මාණකරණයේ යෙදෙයි. | ■ ඇඹීමේ ශිල්ප ක්‍රමය<br>• සමබරතාව<br>• ත්‍රිමාණත්වය<br>• පරිමාණය හා පරිමාව<br>• ඒකත්වය<br>■ ඇඹීමේ ශිල්පක්‍රමය ඇසුරෙන් නිර්මාණ<br>• සරල මානව රූප<br>• සරල සත්ත්ව රූප<br>■ සරල හැඩ ගොඩනැඟීම<br>■ මැටි මාධ්‍ය | • ඇඹීම, නෙළීම හා ගොඩනැඟීම යන ශිල්පක්‍රම භාවිතයට ගනියි.<br>• සරල මානව හා සත්ත්ව රූප නිර්මාණය කරයි.<br>• සම්පිණ්ඩනය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 10 |
| | 5.2 නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කර නිර්මාණකරණයේ යෙදෙයි. | ■ නෙළීමේ ශිල්ප ක්‍රමය<br>• සමබරතාව<br>• ත්‍රිමාණත්වය<br>• පරිමාණය හා පරිමාව<br>• ඒකත්වය<br>■ නෙළීමේ ශිල්පක්‍රම ඇසුරෙන් නිර්මාණ<br>• අල්ප උන්නත කැටයම්<br>■ සරල හැඩ ගොඩනැඟීම<br>■ මාධ්‍ය<br>• රිජිෆෝම් | | |
| | 5.3 එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිත කර නිර්මාණකරණයේ යෙදෙයි. | ■ එකලස් කිරීමේ ශිල්ප ක්‍රම<br>• සමබරතාව<br>• ත්‍රිමාණත්වය<br>• පරිමාණය හා පරිමාව<br>• ඒකත්වය<br>■ සරල හැඩ ඇසුරෙන් නිර්මාණ<br>• උත්සව අවස්ථා සඳහා යෝග්‍ය නිර්මාණ<br>■ විවිධ මාධ්‍ය | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරා ගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි. | 6.1 ශ්‍රී ලංකාවේ පාරම්පරික ශාන්තිකර්ම ආශ්‍රිත දෘශ්‍ය කලා අංග රසවිඳිමින් අධ්‍යයනය කරයි. | ■ පාරම්පරික ශාන්තිකර්ම ආශ්‍රිත දෘශ්‍ය කලා අංග<br>• කොහොඹා කංකාරිය ආශ්‍රිත සැරසිලි අංග<br>• දෙවොල් මඩුව ආශ්‍රිත සැරසිලි අංග<br>• පහන් මඩුව ආශ්‍රිත සැරසිලි අංග<br>• කුම්බාබිෂේකම් - යාගසාලෙයි ආශ්‍රිත සැරසිලි අංග | • ශ්‍රී ලංකාවේ පාරම්පරික ශාන්තිකර්ම ආශ්‍රිත දෘශ්‍ය කලා අංගවල සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරයි. | 06 |
| | 6.2 ශ්‍රී ලංකාවේ පාරම්පරික මැටි කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි. | ■ පාරම්පරික මැටි කර්මාන්තය<br>• ඓතිහාසික පසුබිම<br>• ව්‍යාප්ත ප්‍රදේශ<br>• ශිල්ප ක්‍රම<br>• මාධ්‍ය<br>• නිෂ්පාදිත භාණ්ඩ හා උපකරණ<br>• කලාත්මක ලක්ෂණ | • ශ්‍රී ලංකාවේ පාරම්පරික මැටි කර්මාන්තය සහ පිත්තල කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ සොයා බලයි.<br>• මැටි සහ පිත්තල කලා නිර්මාණ රසවිඳීමේ හැකියාව ලබයි. | |
| | 6.3 ශ්‍රී ලංකාවේ පාරම්පරික පිත්තල කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි. | ■ පාරම්පරික පිත්තල කර්මාන්තය<br>• ඓතිහාසික පසුබිම<br>• ව්‍යාප්ත ප්‍රදේශ<br>• ශිල්ප ක්‍රම<br>• මාධ්‍ය<br>• නිෂ්පාදිත භාණ්ඩ හා උපකරණ<br>• කලාත්මක ලක්ෂණ | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. | 7.1 බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි. | ■ බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා<br>• ආසන<br>- පද්මාසනය<br>- වජ්‍රාසනය<br>• ආසන ක්‍රම<br>- පද්මාසන<br>- වීරාසන<br>- භද්‍රාසන<br>• මුද්‍රා<br>- ධ්‍යාන මුද්‍රාව<br>- වරද මුද්‍රාව<br>- විතර්ක මුද්‍රාව<br>- භූමි ස්පර්ශ මුද්‍රාව<br>- ධර්ම චක්‍ර මුද්‍රාව<br>- පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව<br>- අභය මුද්‍රාව<br>- කටක හස්ත මුද්‍රාව | • බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා හඳුනා ගනියි.<br>• ආසන, ආසන ක්‍රම හා මුද්‍රා විශේෂතා නිරීක්ෂණය කරමින් විස්තර කරයි. | 14 |
| | 7.2 ඓතිහාසික හින්දු මූර්තිවල ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි. | ■ හින්දු මූර්තිවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා<br>• ආසන<br>- පද්මාසනය<br>- භද්‍රාසනය<br>• ආසන ක්‍රම<br>- ලලිතාසන<br>- රජලීලාසන<br>- පර්යංක ආසන<br>• මුද්‍රා<br>- අභය මුද්‍රාව<br>- නමස්කාර මුද්‍රාව<br>- වරද මුද්‍රාව<br>- විතර්ක මුද්‍රාව<br>- ගජහස්ත මුද්‍රාව<br>- කටකහස්ත<br>- ලෝල හස්ත | • හින්දු මූර්තිවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා හඳුනා ගනියි.<br>• හින්දු මූර්ති ආසන, ආසන ක්‍රම හා මුද්‍රා විශේෂතා නිරීක්ෂණය කරමින් විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අධ්‍යයනය කරයි. | ■ යුරෝපා ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර<br>• ප්‍රංශයේ ලැස්කෝ<br>• ස්පාඤ්ඤයේ ඇල්ටමයිරා<br>- ඓතිහාසික පසුබිම<br>- ප්‍රදේශ<br>- ශිල්ප ක්‍රම<br>- මාධ්‍ය<br>- මාතෘකා/වස්තු විෂය<br>- කලාත්මක ලක්ෂණ | • යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර පිළිබඳ විමර්ශනය කරයි.<br>• යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල විශේෂතා හඳුනාගෙන විස්තර කරයි. | |
| | 7.4 දේශීය සාම්ප්‍රදායික සැරසිවල එන සත්ත්ව රූප අධ්‍යයනය කරයි. | ■ දේශීය සාම්ප්‍රදායික සත්ත්ව රූප<br>- හංසයා<br>- හංස පූට්ටුව<br>- සිව් හංස පූට්ටුව<br>- සිංහයා, සිංහම්<br>- ගවයා<br>- ඇතා<br>- අශ්වයා<br>- ගිරවා<br>- මොනරා<br>- යාලි<br>- ඇත්කඳ ලිහිණියා<br>- ගජසිංහ<br>- සරපෙන්දියා<br>- හේරුණ්ඩ පක්ෂියා | • දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල එන සත්ත්ව රූප නම් කරයි.<br>• දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල එන සත්ත්ව රූප යොදාගනිමින් කරනු ලැබූ විවිධ මාධ්‍ය සහ නිර්මාණ හඳුනාගෙන විස්තර කරයි.<br>• එම සත්ත්ව රූප සැරසිලිවල නිර්මාණාත්මක බව ශෛලීගතබව හා කලාත්මක ලක්ෂණ අගය කරයි. | |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** ඃ **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1** ඃ **මානව හා සත්ත්ව රූප අධ්‍යයනය කර චිත්‍ර ඇඳ වර්ණ කරයි.**

**ක්‍රියාකාරකම 1.1.1** ඃ **''මානව ඉරියව්වු ඇඳ වර්ණ කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ
- මානව රූපයක කොටස් හා ක්‍රියාකාරිත්වය විස්තර කරයි.
- මානව රූප ඇඳීමට පෙර මානව ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම වැදගත් බව අවබෝධයෙන් ප්‍රකාශ කරයි.
- විවිධ ඉරියව්වලින් යුත් මානව රූපවල දළ සටහන් අඳියි.
- මානව රූප ඇඳ වර්ණ ගන්වයි.
- නිම කළ නිර්මාණ රසවිඳියි. අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- විවිධ ඉරියව්වු දැක්වෙන මානව රූප ඇතුළත් දළ සටහන්, ඡායාරූප, මූර්ති හා නිදර්ශන චිත්‍ර
- සජීව මානව ආදර්ශන
- පාඩම සංවර්ධනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** ඃ

**පියවර 1.1.1.1** ඃ
- විවිධ ඉරියව්වු දැක්වෙන මූර්ති, චිත්‍ර නිදර්ශන ප්‍රදර්ශනය කරමින් හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් හෝ පාඩමට පිවිසෙන්න.
- විවිධ සිද්ධි හා සබැඳි ක්‍රියාකාරකම් ආශ්‍රිත ව දැකිය හැකි මානව ඉරියව්වු පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- මානව රූප නිර්මාණයේ දී තලයට උචිත විවිධ ඉරියව්වලින් යුත් මානව රූප සම්පිණ්ඩනය කරන ආකාරය නිදසුන් සහිත ව පහදා දෙන්න.
- මානව ඉරියව්වු අධ්‍යයනය කර දළ සටහන් ඇඳ, ත්‍රිමාන ලක්ෂණ මතු වන ආකාරයෙන් වර්ණ කළ හැකි බව අවධාරණය කරවන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 1.1.1.2** ඃ
- නිදර්ශන චිත්‍ර ආශ්‍රයෙන් හෝ සජීව ආදර්ශන භාවිත කර හෝ විවිධ මානව ඉරියව්වු ඇතුළත් දළ සටහනක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- නිර්මාණකරණයට අවශ්‍ය උපකරණ භාවිතයට මඟ පෙන්වන්න.
- මානව ඉරියව්වු සම්පිණ්ඩනය කිරීමේ දී අවශ්‍ය වන සංරචන මූලිකාංග පිළිබඳ ව අවධාරණය කරවන්න.
- වර්ණ ගැන්විය හැකි විවිධ ශිල්පක්‍රම ඇති බව පෙන්වා දෙමින් ත්‍රිමාන ලක්ෂණ දැක්වෙන ආකරයට වර්ණ කිරීමට උපදෙස් ලබාදෙන්න.
- අවශ්‍ය තැන්හි දී ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දෙන්න.
- නිම කළ කෘති පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 60 යි)

පියවර 1.1.1.3 ඃ

- අහඹු ලෙස තෝරාගත් සිසු නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.
- නිර්මාණ පිළබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරිමට අනෙකුත් සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසු නිර්මාණ උදාහරණ ලෙස ඉදිරිපත් කරමින් මානව රූප ඇඳීම පිළිබඳ ව ඔබේ අදහස් සංක්ෂිප්ත ව දක්වන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- මානව රූපයක කොටස් හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර කිරීම.
- මානව ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමෙන් මානව ඉරියවු නිවැරදි ව ඇඳිය හැකි බව සාකච්ඡා කිරීම.
- විවිධ මානව ඉරියවු චිත්‍රණය සඳහා තෝරාගැනීම.
- චිත්‍ර ඇඳීමේ මූලික සිද්ධාන්ත ඇසුරෙන් මානව රූපවල දළ සටහන් නිර්මාණය කිරීම.
- විවිධ වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයෙන් රූප වර්ණ කිරීම.
- අන් අයගේ නිර්මාණ රස විඳිමින් අගය කිරීම.

**පහත මාතෘකාව යටතේ පහත දැක්වෙන ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.**

1.1.2 - 'සත්ත්ව ඉරියවු ඇඳ වර්ණ කරමු' - (කාලච්ඡේද - 02)

**නිපුණතාව 1.0** ඃ **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.2** ඃ **ස්වාභාවික හා නිර්මිත පරිසරය ආශ්‍රිත චිත්‍ර සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම 1.2.1** ඃ **''දුක්බර මොහොතක්''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ

- දුක්බර මොහොතක් පිළිබඳ විස්තර කරයි.
- එවැනි අවස්ථා ඉතා සංවේගදායී බව සහකම්පනයෙන් කථා කරයි.
- තේමාවට අදාළ ව මානව රූප හෝ සත්ත්ව රූප හෝ භාවිත කරමින් චිත්‍ර සංරචනය කිරීමේ ක්‍රම අත්හදා බලයි.
- නිම කළ කෘති රස විඳියි. අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- දුක්බර මොහොතක් හා සම්බන්ධ ඡායාරූප, දළ සටහන්, සිතුවම්
- පාඩම සංවර්ධනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** ඃ

**පියවර 1.2.1.1** ඃ

- දුක්මුසු මුහුණින් ඔබ කැමති ඉරියවුවකින් /අභිනයකින් සිසුන් තුළ කුතුහලයක් ඇවිස්සෙන ආකාරයේ භූමිකා රංගනයක යෙදෙමින් හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක යෙදෙමින් හෝ පාඩමට පිවිසෙන්න.
- දුක්බර මොහොතක් හා සම්බන්ධ දළ සටහන් ඡායාරූප හෝ නිදර්ශන චිත්‍ර හෝ ඉදිරිපත් කරමින් ප්‍රකාශිත තේමාව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- එවැනි සිද්ධි ආශ්‍රිත ව දැකිය හැකි විවිධ ඉරියවු. චර්යා රටා හා පාරිසරික ස්වභාවය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- දුක්බර මොහොතක් දක්වෙන චිත්‍ර විවිධ සංසිද්ධීන් පාදක කොට ගෙන නිර්මාණය කළ හැකි බව අවධාරණය වන පරිදි සාකච්ඡාවක් මෙහෙය-වන්න.
- චිත්‍ර සංරචනයේ දී භාවිත මූලිකාංග පිළිබඳ අවධාරණය කරන්න.
  - රේඛා
  - හැඩතල
  - වර්ණ භාවිතය
  - තලය භාවිතය
- තේමාවට අදාළ ව භාවිත සංරචන සිද්ධාන්ත විමසුමට ලක් කරන්න.
  - පරිමාණය හා පරිමාව
  - ත්‍රිමාණ හා ද්විමාන ලක්ෂණ
  - සමබරතාව
  - ප්‍රකාශනය - නිමාව, පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 1.2.1.2 ඃ

- නිදර්ශන චිත්‍ර හා සිසු අත්දැකීම් ආශ්‍රයෙන් 'දුක්බර මොහොතක්'' මාතෘකාව යටතේ පැන්සල භාවිත කරමින් දළ සටහන් ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- චිත්‍ර නිර්මාණය කිරීමේ දී චිත්‍ර සංරචනයේ මූලික සිද්ධාන්ත භාවිතය හා ඉගෙනුම් උපකරණ භාවිතයට මඟ පෙන්වන්න.
- තේමාව හා සබැඳි තෝරා ගත් අවස්ථාවකට අදාළ දළ සටහන සංවර්ධනය කිරීමට සිසුන්ට සහය වන්න.
- විවිධ ශිල්ප ක්‍රම භාවිතයෙන් අඳින ලද නිදර්ශන චිත්‍ර සිසුන්ට පෙන්වා වර්ණ ගැන්වීමේ ක්‍රමවේද ගැන සිසුන් දැනුම්වත් කරන්න.
- දළ සටහන් ඇසුරින් අවසන් චිත්‍රය සම්පිණ්ඩනය කර අභිමත ශිල්ප ක්‍රමයකට අනුව වර්ණ ගැන්වීමට යොමු කරවන්න.
- නිර්මාණය කරන ලද චිත්‍ර, පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කරන්න.

(මිනිත්තු 60 යි)

පියවර 1.2.1.3 ඃ

- සිසු නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණයේ ප්‍රකාශනාත්මක බව හා චිත්‍ර ඇඳීමේ මූලික සිද්ධාන්ත භාවිතය පිළිබඳ ස්වයං ඇගයීමකට අවස්ථාව සලසන්න.
- නිර්මාණය පිළිබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අනෙකුත් සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසු නිර්මාණ තුළ දක්නට ලැබෙන ප්‍රබලතා මෙන් ම සංවර්ධනය විය යුතු තැන් පිළිබඳ ව ඔබගේ අදහස් සංක්ෂිප්ත ව දක්වන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- දුක්බර මොහොතක් හා සබැඳි අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම.
- තමා සිත් ගත් අවස්ථාවක් චිත්‍රණය සඳහා තෝරා ගැනීම.
- චිත්‍ර සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත භාවිත කරමින් චිත්‍රය නිර්මාණය කිරීම.
- අන් අයගේ නිර්මාණ රසවිඳිමින් අගය කිරීම.

**පහත මාතෘකා යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

1.2.2 - ආගමික උත්සවයක බැතිබර මොහොතක් - (කාලච්ඡේද - 02)
1.2.3 - ජාතික නිදහස් උත්සවය - (කාලච්ඡේද - 02)
1.2.4 - වන සතුන් නැරඹීමට වැව් ඉවුරක් අසලට ගිය දා - (කාලච්ඡේද - 02)
1.2.5 - අස්වනු නෙළන ගොවි ගෙවිලියෝ - (කාලච්ඡේද -02)
1.2.6 - බස් නැවතුම් පොළක හෝ දුම්රිය නැවතුම් පොළක හෝ කලබලකාරී අවස්ථාවක් - (කාලච්ඡේද - 02)

නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

නිපුණතා මට්ටම 1.3 : සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීය ලක්ෂණ ආශ්‍රිත චිත්‍ර සංරචනය කරයි.

ක්‍රියාකාරකම 1.3.1 : ''සොබා දහමේ අසිරිය'' චිත්‍රණය කරමු.

කාලච්ඡේද සංඛ්‍යාව : 04 යි.

ඉගෙනුම් පල :
- ''සොබාදහමේ අසිරිය'' සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීය ලක්ෂණ ආශ්‍රිත ව නිර්මාණය කළ හැකි බව විස්තර කරයි.
- පරිසරයේ සුන්දරත්වය ගැන පැහැදිලි කරයි.
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියට අනුව ''සොබාදහමේ අසිරිය'' තේමාවට චිත්‍ර සංරචනය සඳහා දළ සටහන් අඳියි.
- සාම්ප්‍රදායික ශෛලීය ලක්ෂණ ඇසුරින් සොබාදහමේ අසිරිය චිත්‍රණය කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.
- නිර්මාණ රස විඳිමින් අගය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.3.1.1ට ඇතුළත් ගවේෂණ කාර්ය උපදෙස් පත්‍රිකා
- සොබාදහමේ අසිරිය දක්වෙන නිදර්ශන චිත්‍ර
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීය ලක්ෂණ සහිත වර්ණවත් චිත්‍ර නිදර්ශන
- පාඩම සංවර්ධනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 1.3.1.1 :
- පාසල අවට පරිසරයේ සුන්දරත්වය නැරඹීමට සිසුන් යොමු කරමින් හෝ සිසුන් විසින් දැක ඇති විවිධ සුන්දර පරිසර දර්ශන පිළිබඳ ව විමසමින් හෝ පාඩමට පිවිසෙන්න.
- ශෛලිගත සම්ප්‍රදායය ඇසුරෙන් නිර්මාණය කළ චිත්‍ර නිදර්ශන පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රදර්ශනය කරන ලද නිදර්ශන චිත්‍ර ආශ්‍රිත ව ශෛලිගත ලක්ෂණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ස්වාභාවික පරිසරයේ අසිරිය චිත්‍රණය කිරීමේ දී ඇසට පෙනෙන සංකීර්ණ හැඩ ඉතා සරල ව ජ්‍යාමිතික හැඩතල ඇසුරින් නිර්මාණාත්මක ව ගොඩනඟන ආකාරය කළු ලෑල්ල භාවිත කරමින් දළ සටහන් ඇඳ පෙන්වමින් සාකච්ඡා කරන්න.
- නිදර්ශන චිත්‍රවල අඩංගු පහත සඳහන් සිද්ධාන්ත පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
  - පරිමාණය හා පරිමාව
  - සමබරතාව
  - ප්‍රකාශනය
  - ද්විමාන ලක්ෂණ
  - රේඛාව හා වර්ණ භාවිතය
  - සංරචනය හා සමස්ත නිමාව

(මිනිත්තු 15 යි)

පියවර 1.3.1.2 ඃ

- මාතෘකාවට අදාළ ව චිත්‍ර නිර්මාණයට සිසුන් යොමුකරවන්න.
- සිසුන්ට චිත්‍ර නිර්මාණයට අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ බෙදා දෙන්න.
- නිදර්ශන චිත්‍ර ආශ්‍රිත ව සාකච්ඡා කළ ''සොබාදහමේ අසිරිය'' තේමාවේ සිත්ගත් අවස්ථාවක් පැන්සල භාවිත කරමින් සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීය ලක්ෂණ අනුව නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
- දළ සටහන ඇඳීමේ දී සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියට අනුව හැඩතල හැසිරවීම හා ඉගෙනුම් උපකරණ විධිමත් ව භාවිතයට සිසුන් මෙහෙය වන්න.
- රේඛා භාවිතයෙන් ගොඩනඟන ලද දළ සැලැස්ම සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියට උචිත අයුරින් ද්විමාන ව වර්ණ ගැන්වීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සිදු කරන්න.
- චිත්‍රණය කරන ලද නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සූදානම් කරවන්න.

(මිනිත්තු 135 යි)

පියවර 1.3.1.3 ඃ

- නිම කරන ලද චිත්‍ර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.
- නිර්මාණය කරන ලද චිත්‍ර පිළිබඳ ව ස්වයං ඇගයීමකට අවස්ථාව සලස්වන්න.
- නිර්මාණ පිළිබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට වෙනත් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියට අනුව චිත්‍ර නිර්මාණ කිරීමේ දී අඩංගු විය යුතු පහත පහත සඳහන් කරුණු සහ අදාළ වෙනත් කරුණු පිළිබඳ අවධාරණය කරන්න.
    - ජ්‍යාමිතික හැඩතල හැසිරවීම මඟින් ස්වාභාවික පරිසරය ශෛලිගත ව දැක්වීම.
    - පර්යාලෝකය හා ත්‍රිමාන ලක්ෂණ භාවිතයට වඩා ද්විමාන ලක්ෂණ භාවිතය
    - හිස් අවකාශය පිරවීම සඳහා නිර්මාණාත්මක මල් මෝස්තර හා විවිධ හැඩතල භාවිතය

(මිනිත්තු 10 යි)

**ඇගයීම සහ තකසේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සොබාදහමේ අසිරිය හා සබැඳි සිද්ධීන් හා අවස්ථා නම් කිරීම.
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීගත ලක්ෂණ පිළිබඳ දැනුම විවිධ නිර්මාණ කටයුතු සඳහා භාවිත කිරීම.
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීය ලක්ෂණ අනුව සොබාදහමේ අසිරිය චිත්‍ර සංරචනය කිරීමේ ක්‍රම ශිල්ප සොයා බැලීම.
- සාම්ප්‍රදායික චිත්‍ර ශෛලි ඇසුරෙන් චිත්‍ර නිර්මාණය කිරීම.
- ශෛලිගත ව ඇඳ ඇති චිත්‍ර නිර්මාණ අගය කරමින් රස විඳීම.

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1** : **පරිසරයේ ඇති ස්වාභාවික සහ නිර්මිත හැඩ රේඛාවෙන් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 2.1.1** : **''සිලින්ඩරාකාර බඳුනක දැමූ හබරල පැළෑටියක් රේඛාවෙන් අඳිමු ''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :
- ද්‍රව්‍යවල මතුපිට ස්වභාවය හා හැඩ පිළිබඳ සාකච්ඡා කරයි.
- ද්‍රව්‍යවල මූලික හැඩ පැන්සල් රේඛාවෙන් අඳියි.
- රේඛාවේ විවිධ ගති ලක්ෂණ භාවිතයෙන් එළිය අඳුර දක්වමින් ත්‍රිමාණ ලක්ෂණ මතු කරයි.
- ද්‍රව්‍ය සම්පිණ්ඩනය සඳහා අදාළ සංරචන සිද්ධාන්ත විධිමත් ව භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් සැකසීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
  - සිලින්ඩරාකාර හැඩැති බඳුනක් (ටින් එකක්, ප්ලාස්ටික් ජෝගුවක් නැතහොත් මැටි බඳුනක්)
  - පත්‍ර තුනක් සහිත කුඩා හබරල පැළෑටියක්
  - ද්‍රව්‍ය තැබීමට ආධාරකයක්
- සුදු කඩදාසි
- 2B,4B,6B වර්ගයේ පැන්සල්
- චිත්‍ර ඇඳීමේ පුවරු සහ වෙනත් අදාළ උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 2.1.1.1** :
- සිලින්ඩරාකාර බඳුනක දමන ලද හබරල පැළෑටිය නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- නිරීක්ෂණය කරන අතරතුර පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.
  - සිලින්ඩරාකාර බඳුනේ ස්වභාවය
  - හබරල පැළෑටියේ පත්‍ර, නටු, නාරටි පිහිටා ඇති ආකාරය හා ඒවායේ රිද්මානුකූල හැඩ, වර්ණ හා මතුපිට ස්වභාවය
  - සිලින්ඩරාකාර බඳුනට හා හබරල පැළෑටියට ආලෝකය පතිත වීමේ දී ඒ මත එළිය හා අඳුර සකස් වී පෙනෙන ආකාරය
  - එළිය අඳුර නිවැරදි ව දැක්වීමෙන් චිත්‍රයක ත්‍රිමාන ලක්ෂණ මතු කළ හැකි ආකාරය
- ද්‍රව්‍ය බලා ඇඳීමේ දී අනුගමනය කළ යුතු සංරචන සිද්ධාන්ත පිළිබඳ නිදර්ශන ඇසුරෙන් සිසුන් දැනුම්වත් කරන්න.
  - තලය භාවිතය
  - එළිය-අඳුර හා ත්‍රිමාන ලක්ෂණ
  - වයනය
  - පරිමාණය හා පරිමාව
  - පර්යාලෝකය

- පැන්සල්/පැස්ටල්/චාකෝල් වැනි මාධ්‍ය මගින් රේඛාවේ විවිධ ගති

ලක්ෂණ ඇසුරෙන් සංරචන සිද්ධාන්ත මතු කළ හැකි ආකාරය ආදර්ශනය කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 2.1.1.2** ඃ

- සුදු කඩදාසි සහ ඇඳීම සඳහා භාවිත කරන මාධ්‍ය බෙදා දෙන්න.
- ඇස් මට්ටමින් පහත ධාරකය මත සිලිණ්ඩරාකාර බඳුනකට දමන ලද හබරල පැළෑටිය පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කර තබන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- සමස්ත නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 2.1.1.3** ඃ

- සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරවන්න.
- ස්වයං ඇගයීමකට අවස්ථාව ලබා දෙන්න.
- සංවර්ධනාත්මක අදහස් සහිත ඇගයීම් අවස්ථා සඳහා අනෙකුත් සිසුන් යොමු කරවන්න.
- සමස්ත ක්‍රියාකාරකම ආවරණය වන පරිදි කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ද්‍රව්‍යවල හැඩ සහ ගති ලක්ෂණ සාකච්ඡා කිරීම.
- ස්වාභාවික හා නිර්මිත ද්‍රව්‍යවල මූලික හැඩ පරිමාණානුකූල ව පැන්සල භාවිතයෙන් ඇඳීම.
- රේඛාවේ විවිධ ගති ලක්ෂණ ඇසුරෙන් එළිය අඳුර දක්වමින් ත්‍රිමාණ ලක්ෂණ මතු කිරීම.
- ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍ර ඇඳීමේ දී අනුගමනය කළ යුතු සංරචන සිද්ධාන්ත විධිමත් ව භාවිත කිරීම.

**පහත මාතෘකාව යටතේ අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.**

2.1.2 - ශබ්දකෝෂයක්, කුඩා ප්ලාස්ටික් ජෝගුවක් සහ බෝලයක් රේඛාවෙන් අධ්‍යයනය කරමු.
- (කාලච්ඡේද - 02)

**නිපුණතාව 2.0** ඃ **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.2** ඃ පරිසරයේ ඇති ස්වාභාවික හා නිර්මිත හැඩ සම්පිණ්ඩනය කර ඇඳ වර්ණ ගන්වයි.

**ක්‍රියාකාරකම 2.2.1** ඃ **''ශබ්ද කෝෂයක්, වීදුරු බෝතලයක්, වොලි බෝලයක්/ නෙට් බෝලයක් ඇඳ වර්ණ කරමු.'**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ
- ඇඳීම සඳහා තෝරාගත් ද්‍රව්‍යවල මූලික හැඩ විස්තර කරයි.
- උචිත පරිදි තලය (චිත්‍ර අඳින කඩදාසිය) භාවිත කර ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ සමස්ත හැඩය දළ රේඛාවෙන් සටහන් කර ගනියි.
- ද්‍රව්‍යවල පරිමාණ, පරිමාව හා පර්යාලෝකය පිළිබඳ සැලකිලිමත් වෙමින් ද්‍රව්‍ය සමූහය අඳියි.
- තෝරා ගත් වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම ඇසුරෙන් ද්‍රව්‍ය සම්පිණ්ඩන පැන්සල් රේඛා චිත්‍රය වර්ණ ගන්වයි.
- එළිය අඳුර හා ත්‍රිමාණ ලක්ෂණ, වයනය වැනි සංරචන සිද්ධාන්ත විධිමත් ව භාවිත කරමින් චිත්‍රය වර්ණ ගන්වා අවසන් කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- ද්‍රව්‍ය බලා ඇඳීම සඳහා අවශ්‍ය යෙදවුම්
  - ශබ්ද කෝෂයක්/තරමක් විශාල ප්‍රමාණයේ පොතක්
  - වීදුරු බෝතලයක්
  - වොලි බෝලයක්/නෙට් බෝලයක්
  - භාණ්ඩ තැබීම සඳහා ආධාරකයක්
- චිත්‍ර ඇඳීම සඳහා කඩදාසි
- පැන්සල්, දියසායම්, පැස්ටල්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 2.2.1.1** ඃ
- සපයාගත් ද්‍රව්‍ය සමූහය ආධාරකය මත සම්පිණ්ඩනය කර එහි සමස්ත හැඩය සහ එකිනෙක ද්‍රව්‍යවල හැඩ නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.
  - ද්‍රව්‍යවල මූලික හැඩ
  - ද්‍රව්‍යවල මතුපිට ස්වභාවය
  - ආලෝකයේ ස්වභාවය අනුව ද්‍රව්‍යවල එළිය සහ අඳුර සැකසෙන ආකාරය
  - ද්‍රව්‍යයක අභ්‍යන්තර මූලික හැඩ හඳුනාගෙන ඒ ඇසුරෙන් එහි බාහිර හැඩය පහසුවෙන් ඇඳිය හැකි ආකාරය
  - සමස්ත ද්‍රව්‍ය සමූහයට ගැළපෙන සේ චිත්‍ර අඳින තලය භාවිත කිරීම
- ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් ඇඳීමේ දී අනුගමනය කළ යුතු සිද්ධාන්ත හඳුන්වාදෙමින් නිරීක්ෂණයට යොමු කරවන්න.

- එළිය-අඳුර, ත්‍රිමාන ලක්ෂණ හා වයනය
- පරිමාණය හා පරිමාව
- පර්යාලෝකය හා තලය භාවිතය

- විවිධ වර්ණ මාධ්‍ය භාවිතයෙන් ද්‍රව්‍යවල ගති ලක්ෂණ මතු කළ හැකි ආකාරය නිදර්ශන ඇසුරෙන් පෙන්වා දෙන්න.

(මිනිත්තු 10 යි)

පියවර 2.2.1.2 ඃ

- පන්තියේ සියලු ම සිසුන්ට හොඳින් ප්‍රදර්ශනය වන සේ ඇස් මට්ටමින් පහත ධාරකය මත ද්‍රව්‍ය සමූහය සකස් කර තබන්න.
- කාලය පිළිබඳ සැලකිලිමත් වීමට උපදෙස් ලබා දෙමින් සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ඇඳීමේ දී හා වර්ණ ගැන්වීමේ දී සිසුන්ට උදවු හා මඟ පෙන්වීම් ලබා දෙන්න.
- නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 50 යි)

පියවර 2.2.1.3 ඃ

- සිසුන්ගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- ස්වයං ඇගයීමකට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් නිර්මාණ පිළිබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- සමස්ත ක්‍රියාකාරකම ආවරණය වන පරිදි කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ සමස්ත හැඩයට අනුව තලය භාවිත කර ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් ඇඳීම.
- එක් එක් ද්‍රව්‍යවල බාහිර හැඩය සඳහා පදනම් වී ඇති මූලික හැඩ හඳුනාගෙන ඒ ඇසුරෙන් ද්‍රව්‍ය සමූහය ඇඳීම.
- එක් එක් ද්‍රව්‍යවල දැකිය හැකි එකිනෙකට වෙනස් වූ හැඩ, පරිමාව හා පරිමාණ ලක්ෂණවලට අනුව ඇඳීම.
- ද්‍රව්‍ය සමූහයේ දැකිය හැකි පර්යාලෝක ලක්ෂණ මතු කර දැක්වීම පිළිබඳ සැලකිලිමත් වීම.
- ද්‍රව්‍යයන්හි විවිධත්වය හා ගති ලක්ෂණ වර්ණයෙන් මතු වන පරිදි වර්ණ කිරීම.
- ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍ර ඇඳීමේ දී අදාළ සිද්ධාන්ත විධිමත් ව භාවිත කිරීම.

**පහත මාතෘකාව යටතේ අනෙකුත් ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.**

2.2.2 - සිලින්ඩරාකාර බඳුනක දැමූ ක්‍රෝටන් අත්තක්, සුදු කඩදාසියකින් ආවරණය කරන ලද පෙට්ටියක් (උදාඃ කි.1 බිස්කට් ඇසුරුම් පෙට්ටියක්) සහ ගස්ලබු ගෙඩියක්/තැඹිලි ගෙඩියක්/කුඩා ප්‍රමාණයේ කළයක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 02)

**නිපුණතාව 3.0 ඃ පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.1** : **නිර්ජීවී හා දිව්‍ය ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඇසුරින් වාටි සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.1.1** : **''සාරි වාටියක් සැරසිලි කර හැඩ බලමු''**

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :
- සැරසිලි ඒකකයක් යනු කුමක් දැයි විස්තර කරයි.
- සාරි වාටියක් සැරසිලි කිරීම සඳහා නිර්ජීවී හා දිව්‍ය ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඒකක භාවිත කරයි.
- තිරස් ව්‍යාප්තියක් සහිත වාටි සැරසිල්ලක් නිර්මාණය කරයි.
- ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් සැරසිල්ලට අදාළ පරිමාණ හා මිනුම් නිවැරදි ව අඳියි.
- නිර්මාණයට උචිත පරිදි මෝස්තර මූලධර්ම අනුගමනය කරයි.
- තෝරාගත් වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් වර්ණ ගන්වයි.
- නිර්මාණ අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 3.1.1.1ට ඇතුළත් ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව
- ඇමුණුම 3.1.1.2ට ඇතුළත් රූප සටහන් පත්‍රිකාව
- වාටි මෝස්තර සහිත සාරි
- පිටපත් කිරීමේ කඩදාසි (tracing papers), පැස්ටල්, දිය සායම්, පෝස්ටර් වර්ණ
- ජ්‍යාමිතික උපකරණ
- පින්සල්, චිත්‍ර අඳින කඩදාසි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 3.1.1.1** :
- වාටි මෝස්තර සහිත සාරි සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සාරි වාටිය සඳහා භාවිත කර ඇති මෝස්තර හා එහි තිරස් ව්‍යාප්තිය පිළිබඳ ව පැහැදිලි කරන්න.
- වාටි මෝස්තරයක දැකිය හැකි සීමා සහ ව්‍යාප්තිය නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කරන්න.
- වර්ණ සීමිත ව භාවිත කර අලංකාර වාටි මෝස්තරයක් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කර දෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 3.1.1.2** :
- ඇමුණුම 3.1.1.1ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාවේ පිටපත් සිසුන් අතරේ බෙදා දෙන්න.
- ඇමුණුම 3.1.1.2ට අදාළ රූප සටහන් පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න/ නැතහොත් ප්‍රදර්ශනය කරන්න.
- ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ බෙදා දෙන්න.
- සිසුන් නිර්මාණකරණයේ යොදවන්න.
- සංගත වර්ණ මාලාවක් භාවිත කිරීමට මඟ පෙන්වන්න.

- නියමිත වේලාවට අනුව නිර්මාණ සාර්ථක ව නිම කිරීමට සිසුන් මෙහෙයවන්න.
- නිර්මාණ ඉදිරිපත් කරවීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 60 යි)

පියවර 3.1.1.3 :

- සිසු නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- එම නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව සිසුන්ට අදහස් දැක්වීමට ඉඩ සලස්වන්න.
- නිර්මාණ ඇගයීමට හා සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සාරි වාටියක තිබිය යුතු ලක්ෂණ සහ සාරි වාටියක් ඇඳීමේ දී අනුගමනය කළ යුතු පියවර විස්තර කිරීම.
- ජ්‍යාමිතික උපකරණ ඇසුරෙන් පරිමාණ හා මිනුම් නිවැරදි ව භාවිත කිරීම.
- තෝරාගත් වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම නිර්මාණශීලී ව භාවිත කිරීම.
- නිර්මාණයට උචිත මෝස්තර මූලධර්ම අනුගමනය කිරීම.
- නිර්මාණකරණයේ දී ස්වීයත්වය ප්‍රකට කිරීම.
- මනා සංයමයකින් යුතු ව ක්‍රියාකාරකමේ නිරත වීම.
- සෙසු නිර්මාණ අගයමින් රස විඳීම.

**ඇමුණුම 3.1.1.1**

## ගවේෂණ / කාර්ය උපදෙස් පත්‍රිකාව

**මෙම ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකාව හොඳින් කියවා, එහි දී ඇති උපදෙස් අනුව නිර්මාණ කාර්යයෙහි නිරත වන්න.**

- ඔබට ප්‍රදර්ශනය කරන සාරි වාටි පිළිබඳ අවධානය යොමු කරමින් ඒවායේ වර්ණ, හැඩතල, රටා භාවිත කර ඇති ආකාරය නිරීක්ෂණය කරන්න.
- ඇමුණුම 3.1.1.2ට අදාළ ව දී ඇති දිව්‍ය, නිර්ජීව හා උද්භිද සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර රූප සටහන් පත්‍රිකා අධ්‍යයනය කරන්න.
- එවැනි රූප සටහන් භාවිත කොට තිරස් ව්‍යාප්තියකට සුදුසු සැරසිලි ඒකක නිර්මාණය කරන්න.
- එහි දී මෝස්තර ඒකකය ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන තිරස් වාටියේ පළල සහ ඒ අනුව මෝස්තර ඒකකයේ දිග සහ පළල ඇඳීම පිළිබඳ සැලකිලිමත් වන්න.
- නිර්මාණය කරන ලද සැරසිලි ඒකක ඇසුරින් ඔබ අභිමතය පරිදි තෝරාගත් සැරසිලි ඒකකය පිටපත් කිරීමේ කඩදාසියකට (Tracing papers) පිටපත් කරගන්න.
- පිටපත් කර ගත් සැරසිලි ඒකකය භාවිත කරමින් චිත්‍ර අඳින කඩදාසිය (Drawing papers ) මත සාරි වාටි මෝස්තරය නිර්මාණය කරන්න.
- එහිදී රිද්මය. සමබරතාව හා ඒකත්වය වැනි මෝස්තර මූලධර්ම අනුගමනය කිරීමට සැලකිලිමත් වන්න.


- සාරි වාටියේ තිරස් අවකාශය තුළ ක්‍රමික ගලා යාමක් සහිත ව මෝස්තර ඒකකය ව්‍යාප්ත කිරීමට කටයුතු කරන්න.
- වර්ණ ගැන්වීම සඳහා සංගත වර්ණ මාලාවක් තෝරා ගන්න.
- වර්ණ සකසා ගැනීමේ දී ජලය අඩුවෙන් භාවිත කරන්න.
- තලය මත වර්ණ සමාන ව පැතිර යන සේ (පදාස ක්‍රමයට) වර්ණ ගන්වන්න.
- නිර්මාණයේ අලංකාරය තීව්‍ර වන ලෙස අභිමත වර්ණයකින් බාහිර රේඛා යොදන්න.
- නිර්මාණකරණයේ දී පිරිසිදු බව පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- ඔබේ නිර්මාණය පන්තියේ ප්‍රදර්ශනයට සූදානම් කරන්න.

**ඇමුණුම 3.1.1.2**

## රූප සටහන් පත්‍රිකාව


## දිව්‍ය, නිර්ජීවී හා උද්භිද ගනයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඒකක

### දිව්‍ය සැරසිලි



සූර්යය (ඉර)


චන්ද්‍රයා (හඳ)




### නිර්ජීවි සැරසිලි මෝස්තර



අරිම්බුව




කුන්දිරික්කන්




පනාව




දිය රැළි




ගල් බිංදුව



හවඩිය




තනිපට හා දෙපට ලණුව




සුළිය

**උද්භිද සැරසිලි මෝස්තර**



පලාපෙති මෝස්තර



ලියවැල් මෝස්තර

අන්නාසි මල



**පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

3.1.2 - ''සරොම් වාටියක් සැරසිලි කරමු.''- (කාලච්ඡේද - 02)

නිපුණතාව 3.0 ඃ **පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.**

නිපුණතා මට්ටම 3.2 ඃ **වර්ණවත් ශාක පත්‍රයක හැඩය හා එහි වර්ණ සංකලනය අධ්‍යයනය කර සැරසිලි සඳහා භාවිත කරයි.**

ක්‍රියාකාරකම 3.2.1 ඃ ''ශාක පත්‍ර මවන රටා''

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 03 යි.

ඉගෙනුම් පල ඃ
- ව්‍යාප්ත මෝස්තරයක තිබිය යුතු ලක්ෂණ නම් කරයි.
- ස්වාභාවික පරිසරයේ දැකිය හැකි ශාක පත්‍ර ඇසුරින් සරල සැරසිලි ඒකක නිර්මාණ කරයි.
- සැරසිලි ඒකක ව්‍යාප්ත කර සැරසිල්ලක් සැලසුම් කරයි.
- ස්වාභාවික ශාක පත්‍රවල දැකිය හැකි වර්ණ සංකලන අධ්‍යයනය කරමින් සැලසුම් කළ ව්‍යාප්ත සැරසිල්ල වර්ණ ගන්වයි.
- සංයමයකින් යුතු ව කාර්යයේ නිරත වෙයි.
- නිර්මාණ අගයයි. රස විඳියි.

ගුණාත්මක යෙදවුම් ඃ
- ස්වාභාවික පරිසරයෙන් සොයාගත් විවිධ හැඩැති වර්ණවත් ශාක පත්‍ර
- ව්‍යාප්ත සැරසිලි දැක්වෙන රෙදිපිළිවල වර්ණ පින්තූර
- චිත්‍ර අඳින කඩදාසි, පිටපත් කිරීමේ කඩදාසි, පැන්සල්, වර්ණ මාධ්‍ය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 3.2.1.1 ඃ
- ස්වාභාවික පරිසරයෙන් සපයාගත් ශාක පත්‍ර නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- නිරීක්ෂණ කරන ලද ශාක පත්‍රවල ගති ලක්ෂණ, වර්ණ සංකලන පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අභිමත ශාක පත්‍ර ඇසුරින් සරල සැරසිලි ඒකකයක් නිර්මාණයට මඟ පෙන්වන්න.

(මිනිත්තු 10 යි)

පියවර 3.2.1.2 ඃ
- නිර්මාණය කළ සැරසිලි ඒකකය පිටපත් කිරීමේ කඩදාසියකට පිටපත් කිරීම සඳහා උපදෙස් ලබා දෙන්න.
- පිටපත් කරන ලද සැරසිලි ඒකකය රටාවකට අනුව නැවත නැවත යොදමින් ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කිරීමට මඟ පෙන්වන්න.
- අධ්‍යයනය කළ ස්වාභාවික වර්ණ සංකලන ඇසුරෙන් ව්‍යාප්ත සැරසිල්ල වර්ණ ගැන්වීමට යොමු කරවන්න.
- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 3.2.1.3 ඃ
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරවන්න.

- ස්වයං ඇගයීමට සිසුන්ට ඉඩ ප්‍රස්තාව ලබා දෙන්න.
- සෙසු නිර්මාණ අගය කිරීමට සහ රස විඳීමට සිසුන් මෙහෙයවන්න.
- සිසුන්ගේ නිර්මාණ තව දුරටත් සංවර්ධනය කරගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ව්‍යාප්ත සැරසිල්ලක් යනු කුමක් දැයි විස්තර කිරීම.
- ශාක පත්‍ර නිරීක්ෂණයෙන් පසු වඩාත් සාර්ථක ලෙස සරල හැඩ නිර්මාණය කිරීම.
- උචිත වර්ණ හා වර්ණ මාධ්‍ය භාවිතයෙන් සාර්ථක නිර්මාණයක් කිරීම.
- සිසු නිර්මාණ ඇගයීම හා රස විඳීම.

**නිපුණතාව 3.0** ඃ **පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.3** ඃ **මුළුතල සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.3.1** ඃ **''කුශන් කවරයක් නිර්මාණය කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 03 යි.

**ඉගෙනුම් පල** ඃ
- මුළුතල මෝස්තරයක තිබිය යුතු ලක්ෂණ නම් කරයි.
- කුශන් කවරයක් සඳහා අභිමත මෝස්තරයක් නිර්මාණය කරයි.
- සංගත විසංගත වර්ණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව වර්ණ භාවිත කරයි.
- මනා සංයමයකින් යුතු ව නිර්මාණකරණයේ නිරත වෙයි.
- පෙර දැනුම අර්ථවත් ව නව නිර්මාණ සඳහා යොදා ගනියි.

ගුණාත්මක යෙදවුම් ඃ
- ඇමුණුම 3.3.1.1ට ඇතුළත් ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකා
- ආදර්ශ කුශන් කවර/ විවිධ කුශන් කවර දැක්වෙන පින්තූර
- පිටපත් කිරීමේ කඩදාසි, කාබන් කොළ, චිත්‍ර ඇඳීමේ උපකරණ
- අමුරෙදි
- රෙදි පින්තාරු තීන්ත (Fabric paint), තීන්ත මිශ්‍ර කරන ද්‍රව මාධ්‍ය , පින්සල් (අංක 2, 4, 6), වර්ණ ඵලකයක්, ජල බඳුනක්, අමු රෙද්දේ ප්‍රමාණයට ඉටි කොළ කැබැල්ලක් හා රෙජිෆෝම් බෝඩ් කැබැල්ලක්, ඇල්පෙනෙත්ති

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 3.3.1.1 ඃ
- ආදර්ශ කුශන් කවර/ කුශන් කවර දැක්වෙන පින්තූර, සිසුන් අතින් අත යවා නිරීක්ෂණයට යොමුකරවන්න.
- කුශන් කවරයක තිබිය යුතු ගුණාංග හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡාවට යොමු කරවන්න.
  - හැඩය සහ ප්‍රමාණ
  - සැරසිලි යෙදී ඇති ආකාරය
  - වර්ණ
- නිර්මාණය සඳහා යොදාගත හැකි ස්වාභාවික සහ වියුක්ත හැඩ, සංගත සහ විසංගත වර්ණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 3.3.1.2 ඃ
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ බෙදා දෙන්න.
- අඟල් 9 x 9 ප්‍රමාණයේ කුශන් කවරයක් සඳහා අභිමත පරිදි මුළුතල මෝස්තරයකට දළ සටහනක් නිර්මාණයට මඟ පෙන්වන්න.
- සුදුසු පරිදි ජ්‍යාමිතික උපකරණ භාවිත කිරීමට උපදෙස් දෙන්න.
- අඳින ලද දළ සටහන කාබන් කොළය භාවිත කර අමුරෙද්ද මත පිටපත් කරවන්න.
- සංගත හෝ විසංගත හෝ වර්ණ භාවිත කරමින් උචිත පරිදි වර්ණ යෙදීමට යොමු කරවන්න.

- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 90 යි)

පියවර 3.3.1.3 ඃ

- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කිරීමට ඉඩ සලසා දෙන්න.
- නිර්මාණ පිළිබඳ ඇගයීමකට හා සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.


- කුශන් කවරයක තිබිය යුතු ලක්ෂණ සහ එහි භාවිතය පිළිබඳ ප්‍රකාශ කිරීම.
- ජ්‍යාමිතික උපකරණ හා වර්ණ අවබෝධයෙන් යුතු ව භාවිත කිරීම.
- තමන් තුළ වූ කලාත්මක හැකියාව, ශක්‍යතා, නිර්මාණශීලී බව නිර්මාණකරණය සඳහා භාවිතයට ගැනීම.
- සෙසු නිර්මාණ අගයමින් රස විඳීම.

**ඇමුණුම 3.3.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- කුශන් කවරයක් නිර්මාණය කිරීම සඳහා ඔබට අභිමත සැරසිලි කිහිපයක කුඩා ප්‍රමාණයේ දළ සටහන් අඳින්න. මෙහි දී සමමිතික හෝ නිදහස් හෝ හැඩ සහිත සැරසිල්ලක් ඇඳීමට හැකි ය.
- අඳින ලද දළ සටහන් අතරින් වඩාත් සුදුසු සැරසිල්ල තෝරාගෙන එය අඟල් 9 x 9 ප්‍රමාණයේ චිත්‍ර අඳින කඩදාසියක නැවත අඳින්න. කඩදාසියේ සතර පැත්තෙන් ම අඟල් 1 ප්‍රමාණයක් ලකුණු කර කොටුවක් ඇඳ එම කොටුව තුළ සැරසිල්ල ඇඳීම අලංකාරය සඳහා මෙන් ම රෙද්දක් මත එය ඇඳ වර්ණ කිරීමෙන් පසු කුශන් කවරය මැසීම සඳහා වැදගත් වනු ඇත.

උදා:-



- ඉන් පසු ව සැරසිලි චිත්‍රය අඟල් 9 x 9 ප්‍රමාණයට කපා ගත් අමු රෙද්ද මතට පිටපත් කරගන්න. මෙහි දී මුලින් ම චිත්‍රය පිටපත් කිරීමේ කඩදාසියකට පිටපත් කර ගැනීම කළ යුතු ය. ඉන් පසු ව එය අමු රෙද්ද මත තබන්න. පිටපත් කිරීමේ කඩදාසිය හා අමු රෙද්ද අතරට සැරසිලි චිත්‍රයේ ප්‍රමාණයට කාබන් කොළයක් තබා ඇල්පෙනෙත්ති භාවිත කර නොසෙල්වෙන සේ සම්බන්ධ කර ගන්න.
- ඉතා පරිස්සමෙන් හා ඉවසීමෙන් යුතු ව සැරසිලි චිත්‍රයේ සියලු ම කොටස් අමු රෙද්ද මතට පිටපත් කර ගන්න.
- අමු රෙද්ද මත පිටපත් කර ගන්නා ලද කුශන් කවරයේ සැරසිලි රේඛා චිත්‍රය වර්ණ ගැන්වීම

සඳහා අවශ්‍ය රෙදි පින්තාරු තීන්ත, තීන්ත මිශ්‍ර කරන ද්‍රව මාධ්‍ය, පින්සල් (අංක 2, 4, 6), වර්ණ එලකයක්, ජල බඳුනක්, අමු රෙද්දේ ප්‍රමාණයට ඉටි කොළ කැබැල්ලක් හා රෙජිෆෝම් බෝඩ් කැබැල්ලක්, ඇල්පෙනෙත්ති ආදිය සපයා ගන්න.

- අමු රෙද්දේ අඳින ලද චිත්‍රය වර්ණ ගැන්වීමට ප්‍රථම, චිත්‍ර අඳින කඩදාසියේ ඇඳගත් චිත්‍රය පැස්ටල් හෝ වෙනත් වර්ණ මාධ්‍යයක් හෝ භාවිත කර, අමු රෙද්දේ චිත්‍රය වර්ණ ගැන්වීමට බලාපොරොත්තු වන වර්ණවලට (සංගත හෝ විසංගත හෝ වර්ණ) අනුව වර්ණ ගන්වා බලන්න.
- සැරසිලි චිත්‍රය සහිත අමුරෙද්ද රෙජිෆෝම් බෝඩ් එක මත තබන්න. රෙද්ද හා රෙජිෆෝම් බෝඩ් එක අතරට ඉටි කොළය තබා ඇල්පෙනෙත්ති ආධාරයෙන් හොඳින් රඳවා ගන්න.
- ඉන් පසු ව කඩදාසිය මත අත්හදා බලන ලද වර්ණවලට අනුව සංගත වර්ණ කිහිපයක් හෝ විසංගත වර්ණ කිහිපයක් (රෙදි පින්තාරු සායම්) හෝ තෝරාගෙන වර්ණ කිරීම ආරම්භ කරන්න.
- වර්ණ දෙකක් එකට මිශ්‍ර කිරීම සඳහා හෝ වර්ණයේ පැහැය අඩු වැඩි කිරීම සඳහා රෙදි පින්තාරු වර්ණ මිශ්‍ර කිරීමේ ද්‍රව මාධ්‍ය පමණක් භාවිත කරන්න. ඒ සඳහා ජලය භාවිත කිරීමෙන් වැළකී සිටින්න. ජලය භාවිත කළ හොත් රෙද්ද මත වර්ණ බොඳ වී යාමට හැකි ය. පින්සල් සේදීම සඳහා පමණක් ජලය භාවිත කරන්න.
- වර්ණ සකස් කර ගැනීමේ දී මදක් ඝනට සිටින සේ සකස් කර ගැනීමට සැලකිලිමත් වන්න.
- සැරසිල්ලේ සියලු කොටස් වර්ණ ගැන්වීමෙන් පසු සැරසිල්ලේ ස්වභාවය අනුව සුදුසු වර්ණයක් භාවිත කර වට රේඛා ඇඳ ගැනීමට හැකියාව ඇත. (මේ සඳහා සඳහා වෙළෙඳ පොළෙන් මිලදී ගත හැකි රෙදි පින්තාරු Out liner ද භාවිත කළ හැකි ය.)
- වර්ණ ගන්වා අවසන් කරන ලද කුශන් කවරයේ සැරසිලි චිත්‍රය වියළෙන්නට තබන්න. (දින දෙකක් පමණ හොඳින් වියළුණු පසු චිත්‍රයේ පිටපැත්ත ඉස්ත්‍රික්කයකින් හොඳින් මැදගන්න. අවශ්‍ය පරිදි කුශන් කවරය මසා නිම කර ගැනීමට කටයුතු සලසා ගන්න.

**පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

3.3.2 - නිර්මාණාත්මක සැරසිලි ඒකකයක් හෝ කීපයක් හෝ භාවිත කර සාරි පල්ලුවක් නිර්මාණය කරන්න. (කාලච්ඡේද - 03)

**නිපුණතාව 3.0** : **පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.4** : **ස්වාභාවික හා නිර්මිත හැඩ අධ්‍යයනය කර පාරිභාරික භාණ්ඩ නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.4.1** : **''මැටි බඳුනක් සඳහා මෝස්තරයක් අඳිමු.'**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **03 යි.**

**ඉගෙනුම් පල** :
- ස්වාභාවික හා නිර්මිත පරිසරයේ දක්නට ඇති වස්තූන්ගේ ගති ලක්ෂණ අධ්‍යයනය කර බඳුනක් අලංකරණය කිරීමට අවශ්‍ය නිර්මාණාත්මක සංකල්ප ගොඩනඟා ගන්නා ආකාරය විස්තර කරයි.
- පරිසර අධ්‍යයනයෙන් ලබාගත් සංකල්ප භාවිතයෙන් නිර්මාණකරණයේ යෙදෙයි.
- වර්ණ ගැන්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සංයමයකින් යුතු ව නිර්මාණකරණයේ නිරත වෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- අලංකරණයට තබන බඳුන් සහිත නිදර්ශන චිත්‍ර
- පිටපත් කිරීමට හා චිත්‍ර ඇඳීමට කඩදාසි, ජ්‍යාමිතික උපකරණ, පැන්සල් හා වර්ණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 3.4.1.1** :
- විවිධ හැඩැති, විවිධ ප්‍රමාණවලින් යුත් සහ විවිධ සැරසිලි යෙදූ මැටි බඳුන් ආදර්ශන වෙත සිසු අවධානය යොමු කරමින් පාඩමට පිවිසෙන්න.
- ආදර්ශ බඳුන්වල හැඩය හා සැරසිලි පිළිබඳ ව පහත කරුණු පදනම් කරගෙන සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  - රිද්මය
  - සමබරතාව
  - ඒකත්වය
  - වර්ණ සංයෝජනය

(මිනිත්තු 10 යි)

**පියවර 3.4.1.2** :
- අභිමත හැඩැති බඳුනක් සැලසුම් කිරීමට සිසුන් යොමු කරවන්න.
- ස්වාභාවික හා නිර්මිත පරිසරයේ දක්නට ඇති හැඩතල නිර්මාණාත්මක ව භාවිත කිරීමට උපදෙස් දෙන්න.
- සැලසුම් කරන ලද බඳුනේ හැඩයට උචිත සැරසිල්ලක් නිර්මාණය කිරීමට මඟ පෙන්වන්න.
- නිර්මාණය කරන ලද සැරසිල්ල අභිමත පරිදි වර්ණ ගන්වා නිම කිරීමට මඟ පෙන්වන්න.
- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 100 යි)

**පියවර 3.4.1.3** ඃ
- සිසු නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරවන්න.
- නිම කළ කෘති පිළිබඳ ව ස්වයං විවරණයකට අවස්ථාව ලබාදෙන්න.
- සිසු නිර්මාණ පිළිබඳ ව ප්‍රතිපෝෂණය සහ ඉදිරි පෝෂණය ලැබෙන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම් හා තක්සේරුකරණ සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- පාරිභාරික බඳුන් අලංකරණය කිරීම පිළිබඳ ව විස්තර කිරීම.
- විවිධ ස්ථාන අලංකරණය සඳහා සුදුසු බඳුන් සැලසුම් චිත්‍රණය කිරීම.
- ස්වාභාවික හා නිර්මිත පරිසරයේ දක්නට ඇති වස්තූන්ගේ ගති ලක්ෂණ බඳුන් අලංකරණය සඳහා උචිත පරිදි භාවිත කිරීම.
- මෝස්තර නිර්මාණයට අදාළ සිද්ධාන්ත භාවිත කිරීම.
- නිර්මාණකරණයේ දී මනා සංයමයකින් යුතු ව කටයුතු කිරීම.

**පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

3.4.2 - සුදුසු මාධ්‍යයක් භාවිත කර පෑන් පැන්සල් රඳවනයක් සැලසුම් කර නිර්මාණය කරන්න.
(කාලච්ඡේද - 03)

**නිපුණතාව 4.0** ඃ **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 4.1** ඃ **අක්ෂරකරණයේ සිද්ධාන්ත භාවිතයෙන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි අක්ෂර නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.1** ඃ ''පාසලේ නාම පුවරුව අඳිමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 03 යි.

**ඉගෙනුම් පල** ඃ

- විවිධ භාෂාවන්ට අයත් අක්ෂරවල හැඩ අධ්‍යයනය කරයි.
- විවිධ භාෂා මාධ්‍ය උපයෝගී කර ගනිමින් සැකසුණු වැකිවල නිර්මාණාත්මක අක්ෂරකරණය පිළිබඳ සාකච්ඡා කරයි.
- නිර්මාණාත්මක අක්ෂර භාවිත වන විවිධ අවස්ථා විස්තර කරයි.
- පරිගණකයෙන් හා නිදහස් අතින් ඇඳීමෙන් විවිධ අක්ෂර ලිවීමේ කුසලතාව ලබයි.
- පාසල් නාම පුවරුව නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ

- ඇමුණුම 4.1.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව
- පෝස්ටර් සායම්, පැන්සල්, පින්සල්
- බ්‍රිස්ල් බෝඩ්, පිටපත් කිරීමේ කඩදාසි
- ට්වයින් නූල්, ඇමුණුම් කටු
- තරමක් විශාල අක්ෂර සහිත පුවත්පත්වල පළ වූ විවිධ ආයතන නාමාවලි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 4.1.1.1** ඃ

- පන්තිය ඉදිරිපිට බිත්තියෙහි පුවත්පත්වල පළ වූ විවිධ ආයතනවල නාමාවලි ප්‍රදර්ශනය කරන්න.
- එම නාමාවලි පිළිබඳ සිසු අදහස් විමසන්න.
- විවිධ භාෂාවන්ට අයත් අක්ෂරවල හැඩ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 4.1.1.2** ඃ

- ඇමුණුම 4.1.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- චිත්‍ර ඇඳීමේ ද්‍රව්‍ය හා උපකරණ සිසුනට බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- නිම කළ කෘතීන් ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 100 යි)

පියවර 4.1.1.3 ඃ

- නිම කරන ලද සිසු නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් විසින් නිර්මාණය කරන ලද නාමපුවරුවල තවදුරටත් සංවර්ධනය විය යුතු අවස්ථා සිසුන් සමඟ සාකච්ඡා කරමින් උපදෙස් දෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- විවිධ භාෂාවලට අයත් අක්ෂරවල හැඩ අධ්‍යයනය කිරීම.
- විවිධ භාෂා මාධ්‍ය උපයෝගි කර ගනිමින් සැකසුණු වැකිවල නිර්මාණාත්මක අක්ෂර පිළිබඳ සාකච්ඡා කිරීම.
- නිර්මාණාත්මක අක්ෂර භාවිත වන විවිධ අවස්ථා විස්තර කිරීම.
- පරිගණකයෙන් හා නිදහස් අතින් විවිධ අක්ෂර ඇඳීමේ කුසලතාව ලැබීම.
- පාසල් නාම පුවරුවක් නිර්මාණය කිරීම.

**ඇමුණුම 4.1.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- පන්තියේ ප්‍රදර්ශනය කළ මුද්‍රිත නාමාවලි හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම අක්ෂර කිසියම් ජ්‍යාමිතික රීතියක් අනුව නිර්මාණය වී ඇති අයුරු නිරීක්ෂණය කරන්න.
- පාසල් නාමපුවරුවට සුදුසු වෘත්තාකාර අක්ෂර මෝස්තරයක් තෝරා ගන්න. (මව් බස සහ ඉංග්‍රිසි භාෂාවෙන්)
- අක්ෂර ලිවීමේ ක්‍රමවේද අනුගමනය කරමින් නාම පුවරුවේ ප්‍රමාණවලට ගැළපෙන සේ පාසලේ නම සැලසුම් කරන්න.
- සැලසුම් කරන නම, නාම පුවරුවේ ප්‍රමාණයට අනුව සකස් කර ගත් කඩදාසියක පිටපත් කරගන්න.
- සුදුසු වර්ණ යොදා නාම පුවරුවේ අක්ෂර වර්ණ ගන්වන්න.
- නිර්මාණය කර අවසන් ආදර්ශ පාසල් නාම පුවරුව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.

**පහත මාතෘකාව යටතේ තවත් ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.**

4.1.2 - පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංගයක් සඳහා නිර්මාණාත්මක අක්ෂර යොදා දැන්වීමක් නිර්මාණය කරමු. - (කාලච්ඡේද - 02)

4.1.3. - වෙළෙඳ ව්‍යාපාරයක ඉදිරිපිට සවි කරන නාම පුවරුවක් නිර්මාණය කරමු. (මවුබසින් හා ඉංග්‍රීසි භාෂාවෙන්) - (කාලච්ඡේද - 02)

නිපුණතාව 4.0 : නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම 4.2 : සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම 4.2.1 : ''ළමා ගීතයකට හෝ ළමා කතාන්දරයකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් අඳිමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි.

ඉගෙනුම් පල :
- සන්නිදර්ශන චිත්‍රවල ස්වරූපය විස්තර කරයි.
- ගද්‍ය හෝ පද්‍ය කොටසකින් මතු වන අදහස වඩාත් තීව්‍ර කිරීම සඳහා නිදර්ශනාත්මක සිතුවම් භාවිත කිරීම පිළිබඳ පැහැදිලි කරයි.
- සරල තේමාවකට ගැළපෙන අයුරින් සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි.
- නිම කළ කෘති අගය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- මුද්‍රිත මාධ්‍යවල පළ වූ කෙටිකථා, නවකථා, කවි. ගීත, විශේෂාංග ලිපි සඳහා සිතුවම් කළ සුදු/ කළු හා වර්ණ සන්නිදර්ශන චිත්‍ර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 4.2.1.1 :
- අදාළ ක්‍රියාකාරකමට උචිත සන්නිදර්ශන චිත්‍ර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රදර්ශිත සන්නිදර්ශන චිත්‍ර ඇසුරෙන් මතු වන තේමාව විමසමින් සන්නිදර්ශන චිත්‍ර පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සන්නිදර්ශන චිත්‍ර මඟින් ගද්‍ය හා පද්‍ය නිර්මාණවල අර්ථය තව දුරටත් තීව්‍ර වන බව සිසුනට පහදා දෙන්න.
- ග්‍රැෆික් චිත්‍ර ගණයට අයත් වන සන්නිදර්ශන චිත්‍ර, භාවිත වන විවිධ අවස්ථා ශෛලිය, වර්ණ පිළිබඳ ව මූලික කරුණු මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10 යි)

පියවර 4.2.1.2 :
- සන්නිදර්ශන චිත්‍රය සඳහා සුදුසු ළමා ගීතයක් හෝ ළමා කතන්දරයක් තෝරා ගැනීමට සිසුන්ට මග පෙන්වන්න.
- තෝරාගන්නා ලද නිර්මාණයට ගැළපෙන කළු සුදු හෝ වර්ණයෙන් සන්නිදර්ශන චිත්‍රයක් ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- නිර්මාණ ක්‍රියාවලියේ දී අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- නිම කරන ලද කෘති පන්ති කාමරයේ සුදුසු අයුරින් ප්‍රදර්ශනය කිරීමට සිසුන් දැනුම්වත් කරන්න.

(මිනිත්තු 90 යි)

පියවර 4.2.1.3 :
- නිම කළ කෘති පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරවන්න.

- එක් එක් සිසුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට හා ඇගයීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිර්මාණ පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීම හා සමස්ත සමාලෝචනය සිදු කරන්න.
  - තෝරාගත් අන්තර්ගතය
  - තෝරාගත් ගීතයක/කතන්දරයක අර්ථය මතු කිරීම සඳහා අඳින ලද රූපවල උචිත අනුචිතභාවය/ගැළපීම
  - වර්ණ හා රේඛා භාවිතය
  - සමස්ත සම්පිණ්ඩන ලක්ෂණ

(මිනිත්තු 20 යි)

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගනිමින් ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- සන්නිදර්ශන චිත්‍රවල ස්වභාවය විස්තර කිරීම.
- ගද්‍ය හෝ පද්‍ය කොටසක අර්ථය මතු කිරීම සඳහා අඳින ලද සිතුවම්වල උචිත අනුචිතභාවය පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම.
- සන්නිදර්ශන චිත්‍රයක තිබිය යුතු විශේෂතා අනෙක් ග්‍රැෆික් නිර්මාණ සමඟ සන්සන්දනය කිරීම.
- සරල තේමාවකට ගැළපෙන අයුරින් සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කිරීම.
- නිම කළ කෘති අගය කිරීම.

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති සහ කැටයම් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.1 : ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිත කර නිර්මාණකරණයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 5.1.1 : ''වැතිරී සිටින සත්ත්ව රූපයක් අඹමු''

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි.

ඉගෙනුම් පල :
- ඇඹීම සඳහා භාවිත මැටි මාධ්‍යයේ ස්වභාවය විස්තර කරයි.
- සතකුගේ හැඩයක් සහිත සරල මූර්තියක් නිර්මාණය සඳහා දළ සටහන් අඳියි.
- විවිධ උපකරණ හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- නිර්මාණය නිමහම් කරයි.
- සෙසු අයගේ නිර්මාණ රස විඳියි, අගයයි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.1.1ට ඇතුළත් ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා
- ආදර්ශ සත්ත්ව මූර්ති
- සත්ත්ව රූප සහිත පින්තූර /ඡායාරූප
- ප්‍රමාණය 15 cm x 12 cm පමණ ලී ආධාරකයක්
- ලී පතුරු, කියත් පටිවලින් සකස් කරගත් උපකරණ (Tools)
- පදම් කළ මැටි
- කඩදාසි, පැන්සල්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

පියවර 5.1.1.1 :
- පාඩම ආරම්භ කිරීමට ප්‍රථම ආදර්ශ මූර්ති, ඡායාරූප, පින්තූර සිසුන් ඉදිරියේ ප්‍රදර්ශන කරන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මූර්තියක් නිර්මාණය කිරීමේ පියවර හා සරල ව හැඩතල සම්පිණ්ඩනය කරන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 5.1.1.2 :
- ඇමුණුම 5.1.1.1ට අදාළ ගවේෂණ/ කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීමට කඩදාසි ලබා දෙන්න.
- නිර්මාණය කිරීමට පෙර එහි ඉදිරි පෙනුම, පැති පෙනුම දර්ශනය වන ආකාරයේ දළ සටහන් ඇඳ ගැනීම නිර්මාණය ඉදිකිරීමට පහසු වන බව අවබෝධ කරවන්න.
- අවශ්‍ය උපදෙස් ලබාදෙමින් සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- මැටි මාධ්‍ය හොඳින් පදම් කර ගැනීම නිර්මාණ ක්‍රියාවලිය පහසු කරවන බව පැහැදිලි කර දෙන්න.
- මූර්තියක සියුම් කොටස් මතු කර ගැනීමට උචිත උපකරණ භාවිත කළ යුතු බව පහදන්න.
- නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

(මිනිත්තු 100 යි)

**පියවර 5.1.1.3** ඃ
- සිසුන්ගේ නිර්මාණ පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- ස්වයං ඇගයීමට සහ සාකච්ඡාවට අවස්ථාව ලබා දෙන්න.
- සංවර්ධනාත්මක අදහස් සහිත ඇගයීම් අවස්ථාවකට අනෙකුත් සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ඇඹීම සඳහා භාවිත මැටි මාධ්‍යයේ ස්වභාවය විස්තර කිරීම.
- සත්ත්ව හැඩ සහිත සරල මූර්තියක් නිර්මාණය කිරීම සඳහා දළ සටහන් ඇඳීම.
- විවිධ උපකරණ හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කිරීම.
- නිවැරදි පියවර අනුගමනය කරමින් නිර්මාණය අවසන් කිරීම.
- තමන්ගේ සහ අන් අයගේ නිර්මාණ පිළිබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීම.

**ඇමුණුම 5.1.1.1**

## ගවේෂණ /කාර්ය උපදෙස් පත්‍රිකාව

- ගුරුතුමා /ගුරුතුමිය පන්තියට ඉදිරිපත් කරන සත්ත්ව රූප සහිත මූර්ති/ පින්තූර/ ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න.
- වැතිරී සිටි සත්ත්වයකුගේ ඉරියව්වක් විවිධ පැතිවලින් පෙනෙන ආකාරයේ දළ සටහන් අඳින්න.
- එහි දී නිර්මාණයේ පැති පෙනුම, සහ ඉදිරි පෙනුම දර්ශනය වන ආකාරය අඳින්න.
- දළ සටහන ඇඳීමේ දී පිටතට විහිද යන, වෙන් වූ කුඩා හැඩ හැකි පමණ අඩුවෙන් භාවිත කරන්න.
- ලී ආධාරකය මත පදම් කළ මැටි කොටස් තබමින් දළ සටහනේ දැක්වෙන සත්ත්ව රූපය ගොඩනගන්න.
- මැටි කොටස් සම්බන්ධ කිරීමේ දී ඒවා නොගැලවෙන සේ උපකරණයක ආධාරයෙන් හොඳින් තද කරමින් සම්බන්ධ කර අදාළ හැඩ මතු කිරීමට සැලකිලිමත් වන්න.
- උපකරණ (Tools) භාවිත කර අවශ්‍ය සියුම් හැඩ මතුකර ගන්න.
- නිර්මාණය කරන ලද මූර්තියේ හැඩය හා සත්ත්ව රූපයේ ස්වභාවය අනුව එහි මතුපිට වයනය (මතුපිට ස්වභාවය) නිර්මාණය කරන්න.
- අවසන් කරන ලද නිර්මාණය පන්තියේ ප්‍රදර්ශනය සඳහා සූදානම් කරන්න.

**පහත මාතෘකාව යටතේ අනෙක් ක්‍රියාකාරකම සැලසුම් කර ගන්න.**

5.1.2 - ඇඹීමේ ශිල්ප ක්‍රමය ඇසුරින් සරල මානව රූපයක් නිර්මාණය කරමු. - (කාලච්ඡේද - 02)

නිපුණතාව 5.0 ඃ විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.2 ඃ නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කර නිර්මාණකරණයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 5.2.1 ඃ ''සාම්ප්‍රදායික සත්ත්ව රූප ඇසුරින් අල්ප උන්නත කැටයමක් නිමවමු''

කාලච්ඡේද ඃ 03 යි.

ඉගෙනුම් පල ඃ
- අල්ප උන්නත කැටයමක ලක්ෂණ සාකච්ඡා කරයි.
- නෙළීම සඳහා උපයෝගී කර ගත හැකි මාධ්‍යවල විවිධතා විස්තර කරයි.
- කැටයම් නිර්මාණය සඳහා සාම්ප්‍රදායික සත්ත්ව රූප සම්පිණ්ඩනය කර දළ සටහන් අඳියි.
- රිජිෆෝම් තලය මත අල්ප උන්නත කැටයමක් නිර්මාණය කරයි.
- උපකරණ නිවැරදි ව හසුරුවයි.
- වර්ණ කිරීම සහ නිමහම් කිරීම පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සෙසු නිර්මාණ රස විඳිමින් අගයයි.

ගුණාත්මක යෙදවුම් ඃ
- සාම්ප්‍රදායික සත්ත්ව රූප ඇතුළත් ඡායාරූප
- අල්ප උන්නත කැටයමක්
- නෙළීම සඳහා උපකරණ
- කණ්ඩායමක් සඳහා සුදුසු ප්‍රමාණයේ රිජිෆෝම්
- දළ සටහන සකස් කර ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
- වර්ණ සහ පින්සල්
- ඇමුණුම 5.2.1.1ට ඇතුළත් ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා

**ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

පියවර 5.2.1.1 ඃ
- අදාළ දෘශ්‍යාධාර පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඒවා නැරඹීමට අවස්ථාව සිසුන්ට ලබාදී ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- සාම්ප්‍රදායික චිත්‍රවල සත්ත්ව රූප යෙදීම පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. ඒ පිළිබඳ ව කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
- අල්ප උන්නත කැටයම් නෙළීම සඳහා විවිධ මාධ්‍ය භාවිත කළහ ැකි බව සාකච්ඡා කරන්න.
- රිජිෆෝම් මාධ්‍ය භාවිතයෙන් කැටයමක් පහසුවෙන් නිර්මාණය කළ හැකි බව අවධාරණය කරන්න.
- උපකරණ භාවිතය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.

(මිනිත්තු 10 යි)

පියවර 5.2.1.2 ඃ
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 5.2.1.1ට අදාළ ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකා සිසුන්ට ලබාදෙන්න.
- දළ සටහන් ඇඳීම සඳහා උපදෙස් ලබා දෙන්න.
- රිජිෆෝම් සහ අවශ්‍ය උපකරණ කණ්ඩායම්වලට ලබා දෙන්න.
- අඳින ලද දළ සැලසුමට අනුව කැටයම නිර්මාණය කිරීමට සිසුන් මෙහෙයවන්න.

- එක් එක් කණ්ඩායම් සඳහා අවශ්‍ය සහය ලබා දෙන්න.
- වර්ණ මාධ්‍ය සහ පින්සල් සිසුන්ට ලබා දෙන්න.
- වර්ණ කිරීමට මඟ පෙන්වන්න.
- සුදුසු පරිදි කාලය කළමනාකරණය කරගන්න.

(මිනිත්තු 90 යි)

**පියවර 5.2.1.3** :

- නිම කළ කෘතිය පන්තියට ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්න.
- නිර්මාණ පිළිබඳ ස්වයං ඇගයීමට සහ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- රිජිෆෝම් මාධ්‍යයෙන් අල්ප උන්නත කැටයමක් නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර සිසු නිර්මාණ ඇසුරෙන් පැහැදිලි කර දෙන්න.
- උපකරණ සහ මාධ්‍ය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම අවබෝධ කර දෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- අල්ප උන්නත කැටයම යනු කුමක් දැයි විස්තර කිරීම.
- නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කරමින් කැටයමක් නිර්මාණය කිරීම සඳහා දළ සටහන් ඇඳීම.
- නිවැරදි පියවර අනුගමනය කරමින් රිජිෆෝම් හා උපකරණ භාවිතයෙන් අල්ප උන්නත කැටයමක් නිර්මාණය කිරීම.
- අන් අයගේ අදහස්වලට ගරු කරමින් කණ්ඩායම් හැඟීමෙන් නිර්මාණ කාර්යයක නිරත වීම.
- සෙසු නිර්මාණ ඇගයීම සහ රස විඳීම.

**ඇමුණුම 5.2.1.1**

## ගවේෂණ/කාර්ය උපදෙස් පත්‍රිකාව

- ඔබට ඉදිරිපත් කර ඇති ආදර්ශ අල්ප උන්නත කැටයම්/ පින්තූර දළ සටහන් ආදිය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දක්නට ලැබෙන හැඩ, වර්ණ, නිමාව, මාධ්‍ය භාවිතය, ත්‍රිමාණ බව හොඳින් නිරීක්ෂණය කරන්න.
- ගුරුතුමාගේ /තුමියගේ උපදෙස් පරිදි කණ්ඩායම්වලට බෙදෙන්න.
- සාම්ප්‍රදායික සැරසිලිවල එන සත්ත්ව රූප ඇසුරෙන් නිර්මාණාත්මක සත්ත්ව රූප කැටයමක් සඳහා උචිත අයුරින් දළ සටහන් අඳින්න. ඒවා අතරින් වඩාත් සුදුසු දළ සටහන් කීපයක් තෝරාගෙන, සුදුසු පරිදි රිජිෆෝම් තලය මත සම්පිණ්ඩනය කර අඳින්න.
- සපයාගත් උපකරණ (Tools) යොදා ගෙන අවශ්‍ය තැන් මතුවන පරිදි අනවශ්‍ය කොටස් කපා ඉවත් කරමින් කැටයම නිර්මාණය කරන්න.
- කණ්ඩායමේ සියලු සාමාජිකයන් නිර්මාණ කාර්ය සඳහා සහභාගි වන්න.
- සාම්ප්‍රදායික චිත්‍ර සඳහා භාවිත වන වර්ණමාලා යොදා ගනිමින් වර්ණ ගන්වන්න.
- නිර්මාණය කරන ලද එක් එක් කැටයම් එලක ගුරු උපදෙස් අනුව පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 5.0** ඃ **විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති සහ කැටයම් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.3** ඃ **එකලස් කිරීමේ/ ගොඩ නැඟීමේ ශිල්ප ක්‍රමය භාවිත කර නිර්මාණකරණයේ යෙදෙයි.**

**ක්‍රියාකාරකම 5.3.1** ඃ **''නව නිමැවුමක් කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ
- අපතේ යන විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් මූර්තියක් සැලසුම් කරයි.
- විවිධ මාධ්‍ය එකිනෙකට සම්බන්ධ කිරීමේ දී ඒ සඳහා උචිත ක්‍රමවේද භාවිත කරයි.
- ඉවත ලන ද නිර්මාණශීලී ව හා ක්‍රමවත් ව යොදා ගනිමින් මූර්තියක් ගොඩ නඟයි.
- සෙසු අයගේ නිර්මාණ අගයයි, රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- ඉවත ලන අමුද්‍රව්‍ය භාවිතයෙන් නිම කළ ආදර්ශ නිර්මාණ සහ ඡායාරූප
- ඉවත ලන විවිධ ද්‍රව්‍ය (බෝතල්, කිරිහට්ටි, සිප්පි කටු, කැඩුණු සෙල්ලම් බඩු කැබලි, ලී කැබලි, කම්බි, ප්ලාස්ටික් කැබලි යනාදිය)
- නිර්මාණය සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය එකිනෙකට සම්බන්ධ කර ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (ඇණ, ගම්, නූල්, ගිනි පෙට්ටි, ඉටි පන්දම් යනාදිය)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 5.3.1.1** ඃ
- ආදර්ශ නිර්මාණ සහ පින්තූර පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඉවත ලන විවිධ ද්‍රව්‍ය එකලස් කර නිර්මාණයක් කිරීමේ දී ද්‍රව්‍යයේ පවතින ස්වභාවය හඳුනා ගැනීම ඉතා වැදගත් බවට සිසුන් දැනුම්වත් කරන්න.
- සපයා ගත් ද්‍රව්‍ය එකිනෙකට සම්බන්ධ කිරීමේ දී අනුගමනය කළ හැකි විවිධ ක්‍රමවේද ප්‍රායෝගික ව පෙන්වා දෙන්න.
- නිර්මාණයක් කිරීමේ දී උපකරණ නිවැරදි ව භාවිත කිරීම නිර්මාණ කාර්යය පහසු වීමට හේතු වන බව පැහැදිලි කරන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 5.3.1.2** ඃ
- එකලස් කිරීම සඳහා සිසුන් තෝරාගත් ඉවත ලන විවිධ ද්‍රව්‍ය හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සපයා ගත් ද්‍රව්‍ය නිර්මාණාත්මක ව භාවිත කරමින් එකලස් කිරීමෙන් මූර්තියක් නිර්මාණයට දළ සැලසුමක් ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- දළ සැලසුම ඇසුරෙන් මූර්තිය සම්පිණ්ඩනය කිරීමට උපදෙස් දෙන්න.
- සුදුසු ක්‍රමවේද භාවිත කරමින් ද්‍රව්‍යය එකිනෙකට සම්බන්ධ කර ගැනීමට සහාය වන්න.
- නිර්මාණය රඳවා තැබීම සඳහා පාදමක් අවශ්‍ය වේ නම් එය සපයා

ගත් ද්‍රව්‍යවලින් ම සකස් කරගැනීමට උපදෙස් දී මඟ පෙන්වන්න.

- නිර්මාණයට අනුව සපයාගත් ද්‍රව්‍යවල තිබෙන වර්ණ මතු වන සේ එකලස් කිරීමට උපදෙස් දෙන්න.
- ඒ අනුව වර්ණ භාවිතයෙන් මෙන් ම වර්ණ භාවිතයෙන් තොර ව ද එකලස් මූර්තියක් නිර්මාණය කළ හැකි බව පැහැදිලි කර දෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 5.3.1.3** :

- සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- සියලු නිර්මාණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරමින් කෙටි සමාලෝචනයක යෙදෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- එකලස් කිරීමේ ශිල්ප ක්‍රමය විස්තර කිරීම.
- සපයා ගත් විවිධ ද්‍රව්‍යය භාවිතයෙන් එකලස් කිරීමේ මූර්තියක් නිර්මාණය සඳහා දළ සැලසුම් ඇඳීම.
- ද්‍රව්‍යවල පවතින වර්ණ රටා ගළපමින්, ද්‍රව්‍ය එකිනෙකට සම්බන්ධ කරමින් මූර්තියක් නිර්මාණය කිරීම.
- ද්‍රව්‍ය එකිනෙකට සම්බන්ධ කිරීමේදී උචිත ක්‍රමවේද භාවිත කිරීම.
- නිර්මාණ ඇගයීම හා රස විඳීම.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරෙන් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **ශ්‍රී ලංකාවේ පාරම්පරික ශාන්ති කර්ම ආශ්‍රිත දෘශ්‍ය කලා අංග රසවිඳිමින් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.1** : **''ශාන්ති කර්ම ආශ්‍රිත දෘශ්‍ය කලා අංග අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02 යි.**

**ඉගෙනුම් පල** :
- ශාන්ති කර්ම සඳහා භාවිත දෘශ්‍ය කලා අංග නම් කරයි.
- එම නිර්මාණ සඳහා භාවිත කරනු ලබන මාධ්‍යය සහ ශිල්ප ක්‍රම විස්තර කරයි.
- භාණ්ඩ අලංකරණ ක්‍රම පැහැදිලි කරයි.
- නිර්මාණ අගයමින් රස විඳියි.
- නිර්මාණවල ඇති හැඩ සහ කලාත්මක ලක්ෂණ ස්වනිර්මාණකරණයේ දී භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම 6.1.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.1.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- ශාන්ති කර්ම සඳහා භාවිත දෘශ්‍ය කලා අංගවල ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 6.1.1.1** :
- ශාන්තිකර්ම සඳහා භාවිත දෘශ්‍ය අංගවල පින්තූර ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 6.1.1.2** :
- ඇමුණුම 6.1.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න.
- ඡායාරූප මඟින් විෂය කරුණු තහවුරු කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 6.1.1.3** :
- සුදුසු ක්‍රමවේද භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු සපයා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පදනම් කරගෙන ඇගයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

- ශාන්ති කර්ම සඳහා භාවිත දෘශ්‍ය කලා අංග නම් කිරීම.
- නිර්මාණ සඳහා භාවිත කරනු ලබන මාධ්‍යය සහ ශිල්ප ක්‍රම විස්තර කිරීම.
- භාණ්ඩ අලංකරණ ක්‍රම පැහැදිලි කිරීම.
- නිර්මාණ අගයමින් රස විඳීම.
- නිර්මාණවල ඇති හැඩ සහ කලාත්මක ලක්ෂණ ස්වනිර්මාණ සඳහා භාවිත කිරීම.

ඇමුණුම **6.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති ශාන්ති කර්ම සඳහා භාවිත දෘශ්‍ය කලා අංගවල ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ශාන්ති කර්ම සඳහා භාවිත දෘශ්‍ය කලා අංගවල ඇති විශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධාන ශාන්ති කර්ම හතරක් නම් කරන්න.
2. කොහොඹා කංකාරියේ ප්‍රධාන සැරසිලි අංග දෙකක් නම් කරන්න.
3. දෙවොල් මඩුවේ ප්‍රධාන සැරසිලි අංග දෙකක් නම් කරන්න.
4. පහන් මඩුව ශාන්ති කර්මයේ ප්‍රධාන සැරසිලි අංග දෙකක් නම් කරන්න.
5. කුම්බාබිෂේකම් ශාන්ති කර්මයේ සැරසිලි විස්තර කරන්න.

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම **6.1.1.2**

## කියවීම් පත්‍රිකාව

### ශාන්ති කර්ම ආශ්‍රිත දෘශ්‍ය කලා අංග

- ඈත අතීතයේ සිට ශ්‍රී ලාංකික ජනතාව ශාන්ති කර්ම පැවැත්වීම සාම්ප්‍රදායික ව සිදු කර ඇත. ජනතාව තුළ පවත්නා විවිධ වූ ඇදහිලි හා විශ්වාස පදනම් කර ගෙන ශාන්ති කර්ම පවත්වනු ලැබේ. මෙහි දී ලෙඩ රෝග සුව කිරීම, සෞභාග්‍යය හා සශ්‍රීකත්වය ළඟා කර ගැනීම ආදී සුවිශේෂ කරුණු මුල් තැනක් ගනී.
- ශ්‍රී ලංකාවේ විවිධ ජාතින් විසින් පවත්වනු ලබන ශාන්ති කර්මවල ආශ්‍රිත ව භාවිත කරන දෘෂ්‍ය සැරසිලි අංග විවිධ වේ. සිංහල හා දෙමළ ජනයා අතර ප්‍රචලිත කොහොඹ කංකාරිය, දෙවොල් මඩුව, පහන්මඩු ශාන්ති කර්මය හා කුම්බාබිෂේකම් ශාන්ති කර්මය ආශ්‍රිත ප්‍රධාන දෘෂ්‍ය අංග පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

## කොහොඹා කංකාරිය ශාන්ති කර්මය






**ඉතිහාසය -**

උඩරට නර්තන සම්ප්‍රදායය සමග බැඳි ශාන්ති කර්මයකි. ප්‍රථම කොහොඹා කංකාරි ශාන්ති කර්මය කොහොඹා දෙවියන් මුල් කරගෙන අනුරාධපුර මහමෙවුනාවේ පැවැත්වූ බව රාජාවලියේ සඳහන් වේ. රෝග බිය දුරු කිරීම, සෞභාග්‍යය සශ්‍රීකත්වය ලැබීම පතා මෙම ශාන්ති කර්මය පැවැත්වේ.

**ප්‍රධාන සැරසිලි අංග -**

ප්‍රධාන සැරසිලි අංගය වන්නේ මඩු සැරසිලි කිරීම යි. මඩුව තුළ අයිලය හා යහන සකස් කෙරේ.

**භාවිත අමුද්‍රව්‍ය/මාධ්‍ය -**

සැරසිලි සඳහා ස්වාභාවික ද්‍රව්‍ය ම භාවිත කිරීම මෙහි ඇති විශේෂත්වය යි. විශේෂයෙන් ම ගොප් කොළ, හබරල කොළ, කෙසෙල් පතුරු ඇසුරෙන් කැටයම් කපා භාවිත කරයි.
ගොප් කොළ වියමන් භාවිතයෙන් යහන ඇතිරීම හා පැති වැසීම කරයි.
ගොප් කොළ, පොල් මල්, පුවක් මල්, බුලත්, නාකොළ, ආදියෙන් උඩුවියන් සරසනු ඇත. මඩුව සැරසීමේ දී පොල් වලු, තැඹිලි වලු, දෝතලු වලු, ඉඳි වලු, කෙසෙල් කැන්, අන්නාසි ආදිය භාවිත කරයි.

## දෙවොල් මඩුව ශාන්ති කර්මය







**ඉතිහාසය** -

පහතරට නර්තන සම්ප්‍රදායය හා සම්බන්ධ ශාන්ති කර්මයකි. ප්‍රථම දෙවොල් මඩුව පත්තිනි දෙවඟන හා දෙවොල් දෙවියන් මූලික කරගෙන රුවන්වැල්ල ආශ්‍රිත ව පැවැත්වූ බව සඳහන් වේ. සේරමාන් රජුගේ හිසේ හටගත් රෝගයක් සුව කිරීම අරමුණු කරගෙන මෙම ශාන්ති කර්මය පැවැත්වූ බව උත්පත්ති කතාව යි.

බෝ වන රෝග ආදියෙන් මිදීම, සෞභාග්‍ය ය හා සශ්‍රීකත්වය ළඟා කර ගැනීම පදනම් කර ගෙන මෙම ශාන්තිකර්මය පැවැත්වේ.

**ප්‍රධාන සැරසිලි අංග** -

මෙහිදී ද මඩුව සැරසීම ප්‍රධාන සැරසිලි අංගය යි. මඩුවේ සැරසිලි සඳහා තැඹිලි, පොල්, පුවක්, ඉඳි ආදි විවිධ වලු වර්ග භාවිත වේ. සරල සාම්ප්‍රදායික මෝස්තර කැටයම් සඳහා යොදා ගනී, දේවාභරණ තබන යහන සැරසීම මූලික වශයෙන් සිදු කෙරේ.

එමෙන් ම පත්තිනි තොරණ හා දෙවොල් තොරණ ඉඳි කිරීම සුවිශේෂ සැරසිලි අංග ය. ගොප් දම්වැල් ආදියෙන් සැරසිලි කළ කාලපන්දම් ගහ මඩුව අසලින් ම පිහිටුවන තවත් අංගයකි.

**භාවිත අමුද්‍රව්‍ය/මාධ්‍ය** -

කෙසෙල් පතුරු හා ගොප් කොළ සැරසිලි සඳහා භාවිත ප්‍රධාන අමුද්‍රව්‍ය වේ. හබරල කොළ හා විවිධ වර්ණවත් පත්‍ර ද සැරසිලි සඳහා භාවිත කෙරේ. මෙහි දී ද ස්වාභාවික ද්‍රව්‍ය පමණක් භාවිතයට ගැනීම විශේෂ ලක්ෂණයකි.

## පහන් මඩුව ශාන්ති කර්මය





**ඉතිහාසය -**

සබරගමු නර්තන සම්ප්‍රදායය හා සම්බන්ධ ශාන්ති කර්මයකි. මෙහි දී උත්පත්ති කථාව වන්නේ සේරමාන් රජුගේ හිසේ අමාරුව පදනම් කරගෙන මෙම ශාන්තිකර්මය පැවැත්වූ බව යි. ප්‍රථම පහන් මඩුව පැවැත්වූයේ රුවන්වැල්ල ආශ්‍රිත ව පත්තිනි දෙවඟන හා දෙවොල් දෙවියන් මුල් කරගෙන බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන් ය.

**ප්‍රධාන සැරසිලි අංග -**


මඩුව සැරසීම ප්‍රධාන ම සැරසිලි කාර්යය ලෙස සැලකේ. මඩුව තුළ යහන හා තොරණ සකස් කෙරේ.

පත්තිනි තොරණ හා දෙවොල් තොරණ සුවිශේෂ වේ. විෂ්ණු, කතරගම, සමන්, නාථ යන දෙවිවරුන් සඳහා ද මල් යහන් සකස් කෙරේ. සරල සාම්ප්‍රදායික සැරසිලි ක්‍රම භාවිත වේ.

**භාවිත අමුද්‍රව්‍ය/මාධ්‍ය -**

ගොප් කොළ, හබරල කොළ වැනි ද්‍රව්‍ය බහුල ව භාවිතයට ගැනෙයි.
මඩුව සැරසිලි කිරීමේ දී තැඹිලි, පොල් ආදි වලු වර්ග භාවිත කෙරේ. සැරසිලි සඳහා ස්වාභාවික ද්‍රව්‍ය ම භාවිත කිරීම මෙහි දී දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි.

## කුම්බාබිෂේකම් ශාන්ති කර්මය






**ඉතිහාසය -**

හින්දු කොවිල් ආශ්‍රිත ව පවත්වන ශාන්ති කර්මයකි. කෝවිලක දෛනිකව පවත්වන 'තෛමින්තිය' පූජාවන්වල බිඳී ගිය බලය තවත් ශක්තිමත් කිරීම සඳහාත්, අළුතින් ඉදිකරන ලද කෝවිල් ගොඩනැගිල්ලට අවශ්‍ය බලය ලබාගැනීම සඳහාත් වසර 12 කට වතාවක් මෙම ශාන්ති කර්මය පවත්වනු ලැබේ. මෙම ශාන්ති කර්මය ආදිකාලයේ සිට පැවතෙන්නක් බව ඓතිහාසික ග්‍රන්ථවල ද සඳහන් වී ඇත.

**ප්‍රධාන සැරසිලි අංග -**

මෙම චාරිත්‍රය ඉටු කිරීම සඳහා කෝවිල ඇතුළත හෝ පිටත වෙන ම මඩුවක් සකස් කර ගැනීම සිදුවේ. එය '**යාග සාලෙයි**'නමින් හැඳින්වේ. සතර දිශාවෙන් ම ප්‍රවේශවන පරිදි අඹ ලී වලින් ආවරණය කර, සුදු රෙදිවලින් උඩු වියන් බැඳ සකස් කරන මෙම මඩුව විචිත්‍රවත් කිරීම ප්‍රධාන ම සැරසිලි කාර්යය ලෙස සැලකේ.

ප්‍රධාන දොරටුව මුහුණලා දෙවියන් වෙනුවෙන් එම දෙවියන්ගේ වාහනය සංකේතවත් කරන කොඩිය සමඟ එවැනි ත්‍රිකෝණාකාර කොඩි වැල්වලින් මඩුව සරසා තිබේ. මඩුව සැරසිලි කිරීමේ ඒකක වශයෙන් නෙළුම් මල්, ඕලු මල්, වෘත්ත හා සම චතුරස්‍ර හැඩ යොදා ගැනේ. බිම කෝලම් සැරසිලි මගින් සරසනු ලැබේ.

**භාවිත අමුද්‍රව්‍ය/මාධ්‍ය -**

අඹ ලී, කෙසෙල් ගස් හා පුවක්, උක් සහ අඹ, ගොප් කොළ වර්ග ද පොල් හා පුවක් මල්, පොල් ගෙඩි, මල්වැල් සහ මල්මාලා ආදි ස්වාභාවික ද්‍රව්‍ය මඩුව සැරසීම සඳහා බහුලව ම භාවිත කෙරේ. මෙම ස්වාභාවික ද්‍රව්‍යවලට අමතර ව තැඹිලි, නිල්, රතු, කොළ සහ කහ පැහැති දිලිසෙන හා නොවන රෙදි සහ කඩදාසි වර්ග භාවිතය ද මෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි.

**නිපුණතාව 6.0** ඃ **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරෙන් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.2** ඃ **ශ්‍රී ලංකාවේ පාරම්පරික මැටි කලා කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි.**

**ක්‍රියාකාරකම 6.2.1** ඃ **''පාරම්පරික මැටි කලා කර්මාන්තය අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ
- මැටි කර්මාන්තය ලංකාවේ ඉතා පැරණි ම කර්මාන්තයක් ලෙස ඇගයීමට ලක් කරයි.
- නිර්මාණ සඳහා භාවිත කරනු ලබන මාධ්‍යය සහ ශිල්ප ක්‍රම සොයා බලයි.
- භාණ්ඩ අලංකරණ ක්‍රම විස්තර කරයි.
- නිෂ්පාදිත භාණ්ඩ වර්ග සොයා බලයි.
- ව්‍යාප්ත ප්‍රදේශ විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- ඇමුණුම 6.2.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.2.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- විවිධ වර්ගයේ මැටි භාණ්ඩ සහ විවිධ සැරසිලි මෝස්තර සහිත මැටි බඳුන්වල පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 6.2.1.1** ඃ
- විවිධ වර්ගයේ මැටි භාණ්ඩ සහ සැරසිලි මෝස්තර සහිත මැටියෙන් කරන නිර්මාණවල ඡායාරූප ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 6.2.1.2** ඃ
- ඇමුණුම 6.2.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න.
- ඡායාරූප මඟින් විෂය කරුණු තහවුරු කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 6.2.1.3** ඃ
- සුදුසු ක්‍රමවේද භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු සපයා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇමුණුම 6.2.1.1 සහ ඇමුණුම 6.2.1.2 පදනම් කර ගෙන ඇගයීමේ සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- මැටි කර්මාන්තය සඳහා භාවිතවන ශිල්ප ක්‍රම සහ තාක්ෂණ ක්‍රම සොයා බැලීම.
- පාරිභාරික මැටි භාණ්ඩයක් නිර්මාණය කිරීමේ දී උපයෝගිතාව, කල්පැවැත්ම සහ කලාත්මක බව පිළිබඳ ව සැලැකිලිමත් විය යුතු බව විමර්ශනය කිරීම.
- මැටි භාණ්ඩවල ඇති හැඩ සහ කලාත්මක ලක්ෂණ නව නිර්මාණ සඳහා භාවිත කිරීම.

ඇමුණුම 6.2.1.1

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති විවිධ වර්ගවල මැටි භාණ්ඩ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- එම මැටි බඳුන්වල ඇති විශේෂ ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| මැටි කලා කර්මාන්තයේ ඓතිහාසික පසුබිම | | |
| මැටි කලා කර්මාන්තය පවතින ප්‍රදේශ | | |
| මැටි භාණ්ඩ නිෂ්පාදනය කරන ක්‍රමවේද | | |
| මැටි භාණ්ඩ සඳහා මාධ්‍ය සකස් කර ගැනීම | | |
| මැටි භාවිතයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ | ගෘහ භාණ්ඩ | |
| | ආගමික හා උත්සව භාණ්ඩ | |
| | ඉදිකිරීම් භාණ්ඩ | |
| මැටි භාණ්ඩ අලංකරණය සඳහා භාවිත තාක්ෂණය හා සැරසිලි රටා | | |

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

# කියවීම් පත්‍රිකාව

## ශ්‍රී ලංකාවේ පාරම්පරික මැටි කලා කර්මාන්තය

- සෑම පුරාතන ශිෂ්ටාචාරයක පාහේ ඉපැරණි කර්මාන්තයක ලෙස මැටි කලා කර්මාන්තය පැවති බවට පුරාවිද්‍යාත්මක සාධක පවතී.
- ශ්‍රී ලංකාවේ ද මෙගලිතික සුසාන භූමි ආශ්‍රිත ව එනම් ක්‍රිස්තු පූර්ව 600ට පෙර කාල නිර්ණය කරන ලද මැටි භාණ්ඩ රාශියක් හමු වී තිබේ.
- යාපනය කන්තරෝඩය, අනුරාධපුර, පොළොන්නරුව සහ මහනුවර වැනි ස්ථානවල කරන ලද කැනීම් අනුව පුරාතන සාම්ප්‍රදායික මැටි භාණ්ඩ රාශියක් හමු වී ඇත.
- මැටි භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා ලංකාවේ සෑම පළාතක ම කෙයොලින් මැටි, රතු මැටි සහ කහ පැහැති මැටි ද භාවිත කොට තිබේ. මේ අතරින් කෙයොලින් මැටි වඩාත් ගුණාත්මක බවින් යුක්ත වේ.
- මැටි භාණ්ඩ සකස් කර ගැනීමට පෙර ගල්, වැලි හා රොඩු ආදිය ඉවත් කරමින් මැටි පදම් කරගනු ලැබේ. මේ සඳහා සාම්ප්‍රදායික ව මැටි පයින් පාගා පදම් කරගනු ලබන අතර වර්තමානයේ යන්ත්‍රානුසාරයෙන් ද මැටි අඹරා සකස් කරගැනීම සිදු කරනු ලැබේ.

**නිර්මාණය කරනු ලබන භාණ්ඩ වර්ග**

- ගෘහාසක්ත භාණ්ඩ - වළන්, මුට්ටි, කළ ගෙඩි, ඇතිළි, නැඹිළි, කොරහා, පැන්තාලි, පිළී උෟරා කැට ළින්
- ආගමික කටයුතු හා උත්සව භාණ්ඩ - කොතලය, බුම්මැඩිය, පූනාව, පහන්, පාත්‍රා, හලඹ
- ඉදි කිරීම් ද්‍රව්‍ය - උළු, පෙතිඋළු, කොත්, පිහිලි, නළ
- සාම්ප්‍රදායික නිර්මාණය වූ මැටි භාණ්ඩ වර්ග - හැළි, කොත් කැරලි
- කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩ - ගිනි කබල, උදුන, කෝව

**මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේ ක්‍රම ශිල්ප**

- මේ සඳහා ක්‍රම වේද තුනක් භාවිත කරනු ලැබේ.
  - අත් සකපෝරුව යොදා ගැනීම
  - පා සකපෝරුව යොදා ගැනීම
  - මැටි වළලු සහ මැටි පුවරු උපයෝගි කොටගෙන භාණ්ඩ ඉදි කිරීම, ඇඹීම සහ නෙළීම

**අත් සකපෝරුව**





- ශ්‍රී ලංකාවේ ඉපැරණි ම තාක්ෂණික ක්‍රියාවලිය ලෙස අත් සකපෝරුව භාවිතයෙන් මැටි භාණ්ඩ නිර්මණය කළ බවට සාධක පවතී. සාම්ප්‍රදායික මැටි කර්මාන්තය සඳහා බහුල ව ම භාවිත වී ඇත්තේ මෙම ක්‍රමය යි.
- මේ සඳහා අඩි දෙකක් හෝ දෙකහමාරක් හෝ විෂ්කම්භය ඇති දැව හෝ කළුගල් හෝ භාවිතයෙන් සාදන ලද වෘත්තාකාර පුවරුවක් භාවිත කෙරේ. මෙය පොළොවේ සිට අඟල් හයක් පමණ සිටින සේ කුඩා ගල් කණුවක සිටුවාගනු ලැබේ.
- ඒ මත පදම්කරගත් මැටි තබා එකින් එක භාණ්ඩ නිර්මාණය කර ගනී. සකපෝරුව දෙ පස දෙ දෙනකු වාඩිවී සිටින අතර, එක් අයෙකු සකපෝරුව කරකවන විට අනෙක් පස සිටින තැනැත්තා විසින් භාණ්ඩ ඉදි කරනු ලැබේ.
- මෙ සේ නිර්මාණය කරගනු ලබන මැටි භාණ්ඩ නූලක ආධාරයෙන් කපා ඉවත් කරගනු ලබන අතර, ඒවා මඳක් වියළුණු පසු ඔප මට්ටම් කරගත් වෘත්තාකාර කළුගල් පුවරුවක් සහ දැවයෙන් සාදනු ලැබූ පත්ත නැමති උපකරණයක් භාවිතයෙන් මෙම භාණ්ඩවල යට කොටස (පල්ල) තනාගනු ලැබේ.
- අත් සකපෝරුව භාවිතයෙන් ඉතා විශාල භාණ්ඩ පහසුවෙන් නිර්මාණය කරගත හැකි වේ.

**පා සකපෝරුව**





- මෙම ක්‍රමය නූතනයේ දී භාවිතයට පැමිණ ඇත. සිටගෙන භාණ්ඩ තැනීමට හැකිවීම, පාදය භාවිත කොට සකපෝරුව කරකැවීමට හැකිවීම සහ අවශ්‍ය නම් විදුලියෙන් ක්‍රියාත්මක කරවීමට හැකිවීම මෙම පා සකපෝරුවේ ඇති විශේෂතා වේ.
- මෙම ක්‍රමයේ සකපෝරු, පොළොවේ සිට අඩි තුන හමාරක් පමණ උසට ලෝහ හෝ දැව හෝ භාවිතයෙන් සාදනු ලැබේ.
- මෙම ක්‍රමය භාවිතයෙන් මල් පෝච්චි, කැට, කුඩා පහන්, ගුරුලේත්තු සහ කුඩා ප්‍රමාණයේ විසිතුරු භාණ්ඩ නිර්මාණය කරනු ලැබේ.

**මැටි වළලු සහ මැටි පුවරු උපයෝගී කොටගෙන භාණ්ඩ ඉදි කිරීම, ඇඹීම සහ නෙළීම**

- මැටි බිත්ති පුවරු, කැටයම් පුවරු, කොත් කැරලි, කුඩා මැටි පිළිම, ඌරා කැට ළින්, පූනාව, වැනි භාණ්ඩ නිර්මාණයේ දී මෙම ක්‍රම භාවිත කෙරේ.

**භාණ්ඩ පිළිස්සීමේ තාක්ෂණය**

- මුල් වකවානුවේ දී මැටි බඳුන් මත පිදුරු දමා ඒ මත මැටි තට්ටුවක් අතුරා පුළුස්සා ගනු ලැබේ. අනතුරුව පුලුස්සන ලද මැටි බදුන් තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා නැවතත් ඒවා මත දහයියා හා මැටි අතුරා පිළිස්සීමට ලක් කෙරේ.
- පසුකාලීනව මේ සඳහා ගඩොළු සහ මැටි භාවිතයෙන් සකස් කොටගත් ඉතා සරල පෝරණුවක් භාවිත විය.
- පෝරණුව තුළ වළන් අතුරා, පොල් ලෙලි යොදා එක් දිනක් පිළිස්සීමෙන් පසු ව, දර එකතු කොට සෙන්ටි ග්‍රේඩ් අංශක 600ක පමණ උෂ්ණත්වයක් යටතේ පැ 12ක පමණ කාලයක් භාණ්ඩ පුලුස්සා ගනු ලැබේ.

**භාණ්ඩ අලංකරණ තාක්ෂණය**

- තෙත මැටි බඳුනේ සායම් යොදාගෙන මෝස්තර ඇඳීම
- අච්චු අලංකරණ
- පිලිස්සූ බඳුනේ සායම් යොදා මෝස්තර ඇඳීම
- අව්වේ වියලන ලද මැටි බඳුනේ උල් වූ යකඩ උපකරණයක් මඟින් මෝස්තර ඇඳීම
- දිස්නය ලබා ගැනීම සඳහා ආලේපන යොදා ගැනීම

- මෙම මෝස්තර යෙදීමේ දී සුළිය, සුළි දෙක, දියරැළි, හවඩිය, පනාව, පලාපෙති, තනිපට ලණුව, දෙපට ලණුව, ලියවැල්, භේරුණ්ඩ පක්ෂියා , බෝපත්, කතිරමල, හංසයා සහ සිංහයා බහුල ව යොදා තිබේ.

**මැටි මාධ්‍ය සඳහා ප්‍රචලිත ව පැවති ප්‍රදේශ**

- කැලණිය, මාතලේ හංවැල්ල, කඩුවෙල, රත්නපුරය, කොස්ලන්ද, වේයන්ගොඩ, හොරණ, මහනුවර, දුම්බර, කළුතර, කණ්ඩාවලෙයි, ඔට්ටු සුට්ටාන්, නෙඩුංකේනි, පුදුක්කුඩියිරුප්පු, මුරුංගන්

**නූතනයේ මැටි කලා කර්මාන්තය පවත්නා ප්‍රදේශ**

කැලණිය - නවගමුව, රණාල
කෑගල්ල - මොලගොඩ
අනුරාධපුරය - රඹෑව
මහනුවර - වළල
කුරුණෑගල - පඬුවස් නුවර, පිදුරුවැල්ල, කලුගමුව
මාතර - කපුගම, බෙලිඅත්ත, යටියන, කිරින්ද,
කළුතර - දෙදියවෙලම්,
කිලිනොච්චිය - ධර්මපුර, විසුවමඩු
මුලතිව් - පුදුක්කුඩියිරුප්පු, මුල්ලියවලෙයි
මන්නාරම - නාච්චික්කුඩා, මඩුක්කරෙයි
යාපනය - කල්වියංකාඩු, කොඩිකාමම්, සංගානෙයි
වවුනියාව - නොච්චිකාමම්
මඩකලුව - එරාවුල්, කලවාංජික්කුඩි, පෙරියපොරතිව්

**නිපුණතාව 6.0** ඃ **ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජන මාධ්‍යය ඇසුරෙන් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** ඃ **පාරම්පරික පිත්තල කලා කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි.**

**ක්‍රියාකාරකම 6.3.1** ඃ **''පාරම්පරික පිත්තල කලා කර්මාන්තය''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ
- පිත්තල කර්මාන්තය ලංකාවේ පැරණි කර්මාන්තයක් ලෙස ඇගයීමට ලක් කරයි.
- නිර්මාණ සඳහා භාවිත කරනු ලබන මාධ්‍යය සහ ශිල්ප ක්‍රම පැහැදිලි කරයි.
- භාණ්ඩ අලංකරණ ක්‍රම විස්තර කරයි.
- නිෂ්පාදිත භාණ්ඩ වර්ග නම් කරයි.
- ව්‍යාප්ත ප්‍රදේශ නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- ඇමුණුම 6.3.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 6.3.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- පිත්තලවලින් නිපදවන ලද භාණ්ඩ කිහිපයක්/ එවැනි නිර්මාණවල ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ**

**පියවර 6.3.1.1** ඃ
- විවිධ වර්ගයේ පිත්තල භාණ්ඩවල පින්තූර ප්‍රදර්ශනය කරමින් සිසුන්ගේ අවධානය ලබගන්න.
- එම නිර්මාණ පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 6.3.1.2** ඃ
- ඇමුණුම 6.3.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න.
- පින්තූර මගින් විෂය කරුණු තහවුරු කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 50 යි)

**පියවර 6.3.13** ඃ
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවරදි පිළිතුරු සපයාගැනීමට සලස්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇමුණුම 6.3.1.1 සහ ඇමුණුම 6.3.1.2 පදනම් කරගෙන ඇගයීමේ සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- පිත්තල කර්මාන්තයේ දී භාවිත වන ශිල්ප ක්‍රම සහ තාක්ෂණ ක්‍රම විස්තර කිරීම.
- නිර්මාණ සඳහා භාවිත කරනු ලබන මාධ්‍යය නම් කිරීම.
- භාණ්ඩ අලංකරණ ක්‍රම පැහැදිලි කිරීම.
- නිෂ්පාදිත භාණ්ඩ වර්ග නම් කිරීම.
- ව්‍යාප්ත ප්‍රදේශ නම් කිරීම.
- පිත්තල භාණ්ඩවල ඇති හැඩ සහ කලාත්මක ලක්ෂණ ඇගයීමට ලක් කිරීම.

**ඇමුණුම 6.3.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති විවිධ පිත්තල භාණ්ඩවල පින්තූර හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- ශ්‍රී ලංකාවේ පාරම්පරික පිත්තල කලා කර්මාන්තයේ විශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| පිත්තල කලා කර්මාන්තයේ ඓතිහාසික පසුබිම | | |
| පිත්තල කලා කර්මාන්තය පවතින ප්‍රදේශ | | |
| පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කරන ක්‍රමවේද | | |
| පිත්තල මාධ්‍ය සකස් කර ගැනීම සඳහා අන්තර්ගත ලෝහ වර්ග | | |
| පිත්තල භාවිතයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ | තළන වැඩ | |
| | වාත්තු වැඩ | |
| පිත්තල භාණ්ඩ අලංකරණය සඳහා භාවිත තාක්ෂණය හා සැරසිලි රටා | | |

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 6.3.1.2

## කියවීම් පත්‍රිකාව

### ශ්‍රී ලංකාවේ පාරම්පරික පිත්තල කලා කර්මාන්තය -

- පිත්තල කලා කර්මාන්තය ශ්‍රී ලංකාවේ දමිළ සහ සිංහලයන් අතර ප්‍රචලිත ව පවතින කලා කර්මාන්තයකි.
- ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ සිට ම පිත්තල භාණ්ඩ නිර්මාණය කළ බවට සාධක පවතී. එවැනි පිත්තල භාණ්ඩ රාශියක් ලංකාවේ විවිධ කෞතුකාගාරවල දැකිය හැකි වේ.
- පිත්තල භාණ්ඩ නිර්මාණය ශ්‍රී ලාංකිකයන් අතර වඩාත් ජනප්‍රියත්වයට පත්වන්නේ 18 වන සියවසේ දී ය.
- පිත්තල කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන පිත්තල, නිෂ්පාදිත ලෝහ වර්ගයකි. තඹ (copper) සහ තුත්තනාගම් ( Sinc ) එකතු කොට පිත්තල නිෂ්පාදනය කෙරේ.
- විවිධ අවශ්‍යතා සඳහා පිත්තල භාණ්ඩ නිර්මාණය කර තිබේ.
    i. **පාරිභාරික භාණ්ඩ** : තට්ටු පහන්, පඩික්කම්, ගිරා, කළගෙඩි, සෙම්බු, ගුරුලේත්තු, කොතල, බන්දේසි, ආභරණ පෙට්ටි, සේරක්කාල (ආහාර ගැනීමේ දී පිඟාන තබා ගැනීම සඳහා භාවිත වන භාණ්ඩයක් )
    ii. **ගොඩනැගිලි සහ ගෘහ භාණ්ඩ සඳහා භාවිත ද්‍රව්‍ය** : ඇණ හා සරණේරු, යතුරු තහඩු හා මූණත් තහඩු, යතුරු
    iii. **ආගමික කටයුතුවලට අවශ්‍ය භාණ්ඩ** : ධාතු කරඬු හා චෛත්‍ය කොත්, බුදු පිළිම, පාත්‍රා, සේසත්, තිරුවාසි (රැස්වළල්ල), සීනු
    iv. **අලංකරණ භාණ්ඩ** : බිත්ති සැරසිලි, සත්ත්ව රූප

- තළන වැඩ සහ වාත්තු වැඩ යනුවෙන් ප්‍රධාන ක්‍රම දෙකක් යටතේ පිත්තල භාණ්ඩ නිර්මාණය වේ.

i. **තළන වැඩ (තහඩු වැඩ)** -



තළන වැඩ යනුවෙන් හඳුන්වන්නේ පිත්තල තහඩු උපයෝගී කොටගෙන භාණ්ඩ නිර්මාණය කිරීම යි. මේ ක්‍රමයට අනුව බන්දේසි, හෙප්පු හා පහන් ආවරණ, යතුරු මූණත් තහඩු, තිරුවාසී සහ ආභරණ පෙට්ටි පියන් ආදි පැතලි ආකාරයේ භාණ්ඩ නිර්මාණය කෙරේ.

ii.. වාත්තු වැඩ

පිත්තල වාත්තු වැඩ, ඉටි වාත්තු සහ පස් වාත්තු යන ක්‍රමවේද දෙක යටතේ සිදු කරනු ලැබේ.

**ඉටි වාත්තු ක්‍රමය**





- පිත්තල උණු කොට අච්චුවක වත් කිරීමෙන් භාණ්ඩ සාදා ගැනීමේ ක්‍රමය යි.
- මෙම ක්‍රමයට පිත්තල පහන්, තට්ටු,  තැටි, පාත්‍ර, මල් පෝච්චි, සෙම්බු, කොතල, කෙණ්ඩි, කළ හා පඩික්කම්, සරනේරු, කිල්ලෝටා, ගිරා, යතුරු මූණත් තහඩු, ධාතු කරඬු හා චෛත්‍ය කොත්, දොරවල් සහ පෙට්ටිවල අල්ලු ආදි භාණ්ඩ ද බුදු පිළිම සහ වෙනත් පිළිම වර්ග ද නිර්මාණය කරනු ලැබේ.
- ප්‍රථමයෙන් අවශ්‍ය භාණ්ඩයේ මූලික හැඩය මැටිවලින් සාදා ඒ මත ඉටි තට්ටුවක් අලවා අවශ්‍ය හැඩය ලබා ගනී.
- එම ඉටි ආකෘතිය වටා අඟල් භාගයක පමණ ඝණකමින් යුක්ත ඉටි තට්ටුවක් අලවා එම ඉටි මත අවශ්‍ය සියලු හැඩ යොදනු ලැබේ. අවසානයේ දී  එම ඉටි භාණ්ඩය වැසෙන සේ අඟල් දෙකක් හෝ තුනක් හෝ පමණ ඝණකමට මැටි බඳිනු ලැබේ.
- මෙසේ සාදාගනු ලබන අච්චුව හොඳින් වේළුණු පසු ව එහි සිදුරු කටවල්  පහතට සිටින සේ හරවා ඒ මත ගින්දර දමා රත් කර ඇතුළත ඇති ඉටි උණු කොට ඉවත් කර උණු  වූ පිත්තල ද්‍රාවණය මැටි කවරය තුළට වත් කරනු ලැබේ.

**පස් වාත්තු ක්‍රමය**







- නූතන ශිල්පීන් විසින් ඉතා බහුල ව ම මෙම ක්‍රමය භාවිත කරනු ලැබේ. භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා යොදාගනු ලබන ඉතා සරල ක්‍රමයකි.
- මෙම ක්‍රමයට භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් සාදනු ලැබේ. පහන්, තට්ටු, මල් පෝච්චි වැනි භාණ්ඩ ඒ අතර විශේෂ වේ.
- පස් වාත්තු සඳහා අවශ්‍ය පස් මිශ්‍රණය සඳහා සියුම් ව සකස් කර ගත් ගල් කුඩු සහ මැටි කුඩු යොදා ගනී.
- සතරැස් ලී රාමු තුළට පස් දමා හොඳින් තද කර, ඒ මත පිත්තල භාණ්ඩය තබා තද කර භාණ්ඩයේ හරි අඩක අච්චුවක් සකස් කර ගනී. එම අච්චුව තුළට උණු කොට ගත් පිත්තල වැක්කිරීමෙන් භාණ්ඩයේ එක් පළුවක් සකස් කරගනු ලබන අතර අනෙක් පළුව ද මේ ආකාරයෙන් ම සකස් කොටගෙන පිත්තල වත් කොට එම සකස් කොටගත් පළු දෙක නැවත එක්කොට පාස්සා ගැනීමෙන් සම්පූර්ණ භාණ්ඩය ම සාදාගනු ලැබේ.

**භාණ්ඩ අලංකරණ ක්‍රම**

- පිත්තල තහඩු ක්‍රමයට නිර්මාණය කරන ලද භාණ්ඩ පීර, නියන්, උල් කටු වැනි උපකරණ භාවිතයෙන් ඔප දමා කැටයම් කරනු ලැබේ.

- සැරසිලි කිරීම සඳහා ලියවැල, අන්නාසි මල, හේරුණ්ඩ පක්ෂියා, හංස පූට්ටුව, ලියවැල්, ඉර හඳ රූප, පලාපෙති වැනි සිංහල සැරසිලි මෝස්තර බහුල ව ම යොදාගෙන ඇත.

- සැරසිලි මෝස්තර යෙදීමේ දී යකඩ, තඹ. රන්, රිදී වැනි ලෝහ ද අවශ්‍යතාව අනුව මිශ්‍ර කිරීම සිදු කරනු ලැබේ.

**ශ්‍රී ලංකාවේ පිත්තල කලා කර්මාන්තය පවත්නා ප්‍රදේශ**

මහනුවර - පමුණුව, ගඩලාදෙණිය, පිළිමතලාව, කිරිවවුල, දවුලගල, නත්තරම්පොත (කලාපුරය)
මාතර - බෙලිඅත්ත ප්‍රදේශයේ අඟුල්මඩුව
යාපනය - වන්නාර් පන්නෙයි
මඩකලපුව - පෙරියපෝරතිවු

නිපුණතාව 7.0 ඃ දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.1 ඃ බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 7.1.1 ඃ ''බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරමු''

කාලච්ඡේද සංඛ්‍යාව ඃ 04 යි.

ඉගෙනුම් පල ඃ
- බුදු පිළිමවල ආසන වර්ග නම් කරයි.
- බුදු පිළිමවල මුද්‍රා වර්ග හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- බුදු පිළිමවල ඇති මුද්‍රා, ආසන හා ආසන ක්‍රම විස්තර කරයි.
- බුදු පිළිමවල ඇති මුද්‍රා, ආසන හා ආසන ක්‍රම අඳියි.

ගුණාත්මක යෙදවුම් ඃ
- ඇමුණුම 7.1.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.1.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව
- බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රාවල ඡායාරූප හා රූප සටහන්

ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් ඃ

පියවර 7.1.1.1 ඃ
- විවිධ මුද්‍රා, ආසන සහ ආසන ක්‍රම දැක්වෙන බුදු පිළිමවල පින්තූර සහ රූප සටහන් ප්‍රදර්ශනය කරමින් සිසුන්ගේ අවධානය ලබා ගන්න.
- ඒවා පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.

(මිනිත්තු 15 යි)

පියවර 7.1.1.2 ඃ
- ඇමුණුම 7.1.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න.
- ඡායාරූප සහ රූප සටහන් මඟින් විෂය කරුණු තහවුරු කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් කාර්ය පත්‍රිකාව සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 130 යි)

පියවර 7.1.1.3 ඃ
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු
- සපයාගැනීමට සලස්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමුකරමින් ඇමුණුම 7.1.1.1 සහ ඇමුණුම 7.1.1.2 පදනම් කරගෙන ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- බුදු පිළිමවල ආසන හා ආසන ක්‍රම ඇඳ නම් කිරීම.
- බුදු පිළිමවල මුද්‍රා වර්ග ඇඳ ප්‍රකාශ කිරීම.
- බුදු පිළිමවල ඇති මුද්‍රාවල අර්ථය විස්තර කිරීම.
- ආසන හා ආසන ක්‍රම විස්තර කිරීම.

**ඇමුණුම 7.1.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති බුදු පිළිමවල විවිධ මුද්‍රා සහ ආසන ක්‍රම දැක්වෙන ඡායාරූප සහ රූප සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් කියවන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. බුදු පිළිමවල ආසන හා ආසන ක්‍රම ඇඳ නම් කරන්න.
2. බුදු පිළිමවල මුද්‍රා වර්ග ඇඳ නම් කරන්න.
3. බුදු පිළිමවල ඇති මුද්‍රාවල අර්ථය විස්තර කරන්න.
4. විවිධ ආසන හා ආසන ක්‍රම විස්තර කරන්න.

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

# කියවීම් පත්‍රිකාව

## බුදු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා

### ආසන

- සෑම බුද්ධ ප්‍රතිමාවක් ම පීඨයක් මත පිහිටුවා ඇති අතර, මේ සඳහා පද්මාසනය හෝ වජ්‍රාසනය හෝ බහුල ව ම යොදා ඇත.
- වජ්‍රාසනය යෙදීමේ දී වජ්‍රයක සලකුණත්, පද්මාසනය යෙදීමේ දී පද්මයක ආකාරයත් කැටයම් කොට තිබේ.



පද්මාසනය




වජ්‍රාසනය

### ආසන ක්‍රම

- හිඳි බුද්ධ ප්‍රතිමාවේ දෙපා පිහිටුවා ඇති ඉරියව්ව නැතහොත් හිඳගෙන සිටින ආකාරය ආසන ක්‍රමය ලෙස සැලැකේ.
- වීරාසන, පද්මාසන හා භද්‍රාසන වශයෙන් ප්‍රධාන ආසන ක්‍රම තුනක් වේ.
- ලංකාවේ සෑම හිඳි පිළිමයක ම වීරාසන ක්‍රමයට දෙපා පිහිටුවා ඇති අතර, ඉන්දියාවේ ඉතා බහුල ව ම පද්මාසන ක්‍රමයත්, ස්වල්ප වශයෙන් භද්‍රාසන ක්‍රමයත් යොදා ගෙන ඇත.
- වීරාසන ක්‍රමය යනු, වම් පාදය මත දකුණු පාදය සිටින සේ වාඩි වී සිටින ආකාරය යි.
- පද්මාසන ක්‍රමය යනු, යටි පතුල් දෙක ම උඩ අතට සම ව සිටින සේ තබා වාඩි වී සිටින ආකාරය යි.
- භද්‍රාසනය යනු ඉතා කෙටි ආසනයක් මත හිඳගෙන සිටින ආකාරය යි. දෙපා දණ හිසින් නවා යටි පතුල් පොළොවට ස්පර්ශ වන සේ හිඳ ගෙන සිටීම මෙහි දී සිදු වේ.



භද්‍රාසන ක්‍රමය



පද්මාසන ක්‍රමය



වීරාසන ක්‍රමය

මුද්‍රා -


- බුද්ධ ප්‍රතිමාවක ගුණාංග ප්‍රකාශ කිරීම සඳහා මෙන් ම අවස්ථාව ප්‍රකාශ කිරීම සඳහා සංකේතාත්මක ව දෑත යොදා ඇති ආකාරය මුද්‍රාවක් ලෙසින් හැඳින්වේ.
- ලෝකයේ ඇති බුද්ධ ප්‍රතිමා අධ්‍යයනයේ දී පහත දැක්වෙන පරිදි මුද්‍රා වර්ග කිහිපයක් හඳුනා ගත හැකි වේ.

| | |
|---|---|
| - ධ්‍යාන මුද්‍රාව | - භූමි ස්පර්ශ මුද්‍රාව |
| - පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව | - වරද මුද්‍රාව |
| - ධම්මචක්ක මුද්‍රාව | - විතර්ක මුද්‍රාව |
| - අභය මුද්‍රාව | - කටක හස්ත මුද්‍රාව |


- මේ අතරින් ධ්‍යාන, ධම්මචක්ක, වරද, භූමි ස්පර්ශ, විතර්ක යන මුද්‍රා හිඳි පිළිම සඳහා බහුල ව ම යොදා ඇති අතර අභය, පර දුක්ඛ දුක්ඛිත සහ වරද යන මුද්‍රා හිටි පිළිම සඳහා බහුල ව ම යොදා ඇත.
- මුද්‍රාවලින් ප්‍රකාශිත අර්ථය පහත සඳහන් කර ඇති ආකාරයට සංක්ෂිප්ත කළ හැකියි.

| | | | |
|---|---|---|---|
| i. | ධ්‍යාන මුද්‍රාව | - | ධ්‍යානකට සමවැදී සිටින ආකාරය පෙන්වයි. |
| ii. | අභය මුද්‍රාව | - | අභය හෙවත් නිදහස දීම සංකේතවත් කරයි. මෙය ආශීර්වාද හෙවත් ආශීව මුද්‍රාව ලෙස ද හඳුන්වයි. |
| iii. | විතර්ක මුද්‍රාව | - | ගැටලුවක් විසඳන අවස්ථාව සංකේතවත් කරයි. |
| iv. | භූමි ස්පර්ශ මුද්‍රාව | - | මහ පොළොව සාක්ෂ්‍ය යන අර්ථය දෙයි. බුදු වූ අවස්ථාව පෙන්වීමේ දී බහුල ව මෙම මුද්‍රාව දක්වේ. |
| v. | වරද මුද්‍රාව | - | වරයක් දීම සංකේතවත් කරයි. |
| vi. | පර දුක්ඛ දුක්ඛිත මුද්‍රාව | - | අන්‍යයන්ගේ දුකේදී කම්පාවීම යන්න පරණවිතාණගේ මතයයි. මෙය අනිමිස ලෝචන පූජාව යනුවෙන් ද මතයක් පවතී. |
| vii.. | ධම්මචක්ක මුද්‍රාව | - | ධර්මය දේශනා කරන අවස්ථාව නිරූපිත ය. |
| viii.. | කටක හස්ත මුද්‍රාව | - | යමක් අල්ලා ගෙන සිටින ආකාරය නිරූපිත ය. |





ධ්‍යාන මුද්‍රාව






අභය මුද්‍රාව




කටක හස්ත මුද්‍රාව





විතර්ක මුද්‍රාව





භූමි ස්පර්ශ මුද්‍රාව







වරද මුද්‍රාව



පර දුක්ඛ දුක්ඛිත මුද්‍රාව





ධම්මචක්ක මුද්‍රාව

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **හින්දු ප්‍රතිමාවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.1** : **''හින්දු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **04 යි.**

**ඉගෙනුම් පල** :
- හින්දු පිළිමවල ආසන වර්ග නම් කරයි.
- හින්දු පිළිමවල මුද්‍රා වර්ග හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- හින්දු පිළිමවල ඇති මුද්‍රා, ආසන හා ආසන ක්‍රම විස්තර කරයි.
- හින්දු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා අඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- හින්දු පිළිමවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රාවල ඡායාරූප සහ රූප සටහන්
- ඇමුණුම 7.2.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.1.2ට ඇතුළත් කියවීමේ පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.2.1.1.** :
- විවිධ මුද්‍රා, ආසන සහ ආසන ක්‍රම දක්වෙන හින්දු පිළිමවල පින්තූර රූප සටහන් ප්‍රදර්ශනය කරමින් සිසුන්ගේ අවධානය ලබාගන්න.
- එම හින්දු පිළිම පිළිබඳ සිසු අදහස් විමසන්න.

(මිනිත්තු 15 යි)

**පියවර 7.2.1.2** :
- ඇමුණුම 7.2.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව පන්තියේ කියවීමට සලස්වන්න.
- පින්තූර සහ රූප සටහන් මඟින් විෂය කරුණු තහවුරු කරන්න.
- කියවීම් පත්‍රිකාව ඇසුරෙන් කාර්ය පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 130 යි)

**පියවර 7.2.1.3** :
- සුදුසු ක්‍රමවේදයක් භාවිත කර පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- සදොස් පිළිතුරු නිදොස් කර සමස්ත ප්‍රශ්නාවලියට නිවැරදි පිළිතුරු සපයා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.2.1.1 සහ ඇමුණුම 7.2.1.2 පදනම් කර ගෙන ඇගයීමේ සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- හින්දු පිළිමවල ආසන හා ආසන වර්ග ඇඳ නම් කිරීම.
- හින්දු පිළිමවල මුද්‍රා වර්ග ඇඳ ප්‍රකාශ කිරීම.
- හින්දු පිළිමවල ඇති මුද්‍රාවල අර්ථ විස්තර කිරීම.
- ආසන හා ආසන ක්‍රම විස්තර කිරීම.

**ඇමුණුම 7.2.1.1**

## කාර්ය පත්‍රිකාව

- ප්‍රදර්ශනය කර ඇති හින්දු පිළිමවල විවිධ මුද්‍රා සහ ආසන ක්‍රම දක්වෙන ඡායාරූප සහ රූප සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    1. හින්දු පිළිමවල ආසන වර්ග ඇඳ නම් කරන්න.
    2. හින්දු පිළිමවල මුද්‍රා වර්ග ඇඳ නම් කරන්න.
    3. හින්දු පිළිමවල ඇති මුද්‍රාවල අර්ථ විස්තර කරන්න.
    4. විවිධ ආසන හා ආසන ක්‍රම විස්තර කරන්න.

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

ඇමුණුම 7.2.1.2

## කියවීම් පත්‍රිකාව

### හින්දු ප්‍රතිමාවල ආසන, ආසන ක්‍රම හා මුද්‍රා

**ආසන වර්ග -**

- ප්‍රතිමාව වැඩ සිටින පීඨය ආසනය ලෙස හැඳින්වේ. පද්මය හා භද්‍රය යන ආසන හින්දු ප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි ආසන වර්ග වේ.



**පද්මාසනය** - නෙළුම් මල් පෙතිවලින් අලංකරණය කරන ලද ඕවලාකාර හැඩයක් ලෙස පද්ම ආසනය නිරූපණය කෙරේ.



**භද්‍රාසනය** - මෙය චතුරස්‍රාකාර හැඩයක් ගත් ආසනයකි.

**ආසන ක්‍රම -**

- දෙපා පිහිටුවා ඇති ආකාරය ආසන ක්‍රමය ලෙස හැඳින්වේ. හින්දු ප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි ආසන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

**ලලිත ආසන -**


පීඨය මත හිඳ සිටින ඉරියව්වකි. එක් පාදයක් නමා අනෙක් පාදය නිදහසේ පහතට දමා ගෙන සිටියි. පාර්වති හා සරස්වතී දේවිය මෙම ඉරියව්වෙන් නිරූපණය කර ඇත.

**රාජලීලාසනය -**


වම් පය තිරස් අතට නමා සිටින අතර දකුණු පය සිරස් ව නවා ඒ මත දකුණු අතේ වැළමිට තබාගෙන සිටින ආකාරයෙන් දක්වා ඇත.

**පර්යංක ආසන -**

පුටුවක හිඳ සිටින ඉරියව්වක ආකාරයක් ගනී. මෙහි දී දෙපා නවා පහත තබාගෙන සිටින ආකාරයෙන් දක්වා ඇත.

ලලිත ආසන

රාජලීලාසනය




පර්යංක ආසන

මුද්‍රා -

- ප්‍රතිමාවේ දෑත් නිරූපණය කර ඇති ආකාරය මුද්‍රාව ලෙස හැඳින්වේ.
- දෑත් හසුරුවා ඇති ආකාරය අනුව මුද්‍රා වර්ග නම් කෙරේ. ඒවා සංකේතාත්මක වන අතර විවිධ අර්ථ කථන දක්වා ඇත.
- බොහෝ විට ප්‍රතිමාවක භාව ප්‍රකාශනය හා සමස්ත ගුණය සංකේතාත්මක වශයෙන් නිරූපණය කෙරෙනුයේ මුද්‍රාව මගිනි. හින්දු ප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි එවැනි මුද්‍රා කිහිපයකි.

**i.අභය මුද්‍රාව -**
නිදහස හා ආරක්ෂාව ලබා දීම මෙම මුද්‍රාවෙන් සංකේතවත් කරයි. වැළමිටෙන් අත නමා ඉදිරියට දක්වා ඇත.

**ii.ගජ හස්ත මුද්‍රාව -**
අලි හොඬවැලක ස්වරූපයෙන් අත්ල සහ ඇඟිලි පහළට දිගු කර නිරූපණය කෙරේ. බාධක ඉවත් වී නිදහස ලැබීම සංකේතවත් කෙරේ.

**iii.නමස්කාර මුද්‍රාව/ අංජලි මුද්‍රාව -**
ආයාචනය, ප්‍රාර්ථනය හා වැඳීම යන අදහස් මෙම මුද්‍රාවෙන් නිරූපණය කරයි. දෑත වැළමිටෙන් නමා පපුව ඉදිරියෙන් අත්ල හා ඇඟිලි එකට එකතු කිරීමෙන් මෙම මුද්‍රාව දැක්වේ.

**iv.වරද මුද්‍රාව -**
වරයක් දීම මින් සංකේතවත් කරයි. එසේ ම, පහතට දැමූ අතේ ඉදිරිපසට හැරුණු අත්ල හා ඇඟිලි සහිත ව මෙම මුද්‍රාව නිරූපණය කර පෙන්වයි.

**v.විතර්ක මුද්‍රාව -**
අත්ල ඉදිරිපසට හැරී ඇති අතර, මාපට ඇඟිල්ල මත දබරැඟිල්ල තබා දක්වා ඇත. ගැටලුවක් විසඳන අවස්ථාවක් මුද්‍රාවෙන් අර්ථවත් කර පෙන්වයි.


**vi.කටක හස්ත මුද්‍රාව -**
යමක් අල්වා සිටින ආකාරයට ඇඟිලි නිරූපණය කරයි. මෙම මුද්‍රාව බොහෝ විට ත්‍රිභංග ලක්ෂණ සහිත දේවරූපවල හා ස්ත්‍රෝකරුවන්ගේ රූපවල සුලභව දැකිය හැකි වේ.

**vii.ලෝල හස්ත මුද්‍රාව -**
කාන්තා දේවරූප සඳහා බහුලව භාවිත කෙරේ. පහළට වැටුනු අතෙහි අත්ල සහ ඇඟිලි රිද්මයානුකූලව පොළොවට දිගුවන ලෙස නිරූපණය කර පෙන්වයි. මින් තැන්පත් බව සංකේතවත් කර දක්වයි.




අභය මුද්‍රාව







ගජහස්ත මුද්‍රාව

නමස්කාර මුද්‍රාව


වරද මුද්‍රාව




විතර්ක මුද්‍රාව




කටක හස්ත මුද්‍රාව

ලෝල හස්ත මුද්‍රාව

**නිපුණතාව 7.0** ඃ **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.3** ඃ **යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.3.1** ඃ **''යුරෝපා ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අගයමු''**

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ **02 යි.**

**ඉගෙනුම් පල** ඃ
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍රවල වස්තු විෂය නම් කරයි.
- රූප හා වර්ණ භාවිතය පිළිබඳ ව විස්තර කරයි.
- ප්‍රාග් ඓතිහාසික මානවයාගේ කලා කුසලතාව හා දෛනික ජීවිත තොරතුරු ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** ඃ
- යුරෝපයේ ගුහා චිත්‍ර සටහන් හා ඡායාරූප
  - ඇල්ටමීරා ගුහා චිත්‍ර
  - ලැස්කෝ ගුහා චිත්‍ර
- ඇමුණුම 7.3.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.3.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** ඃ

**පියවර 7.3.1.1** ඃ
- යුරෝපයේ ගුහා චිත්‍ර ඇතුළත් ඡායාරූප සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර නිර්මාණ පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.3.1.2** ඃ
- ඇමුණුම 7.3.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා සුදුසු පරිදි කියවීමට සලස්වන්න.
- ඇමුණුම් 7.3.1.2ට අදාළ කියවීම් පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- කාර්ය කිරීමට සුදුසු උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 60 යි)

**පියවර 7.3.1.3** ඃ
- සිසුන්ගේ පිළිතුරු සාකච්ඡාවට ලක් කරන්න.
- නිවැරදි පිළිතුරු පෙළ ගස්වා පන්තියට ඉදිරිපත් කරවන්න.
- සිසුන් අතර පිළිතුරු පිළිබඳ ව අදහස් හුවමාරු කර ගැනීමට උනන්දු කරවන්න.
- පාඩම සංවර්ධනයට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 10 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඇමුණුම 7.3.1.1 සහ ඇමුණුම 7.3.1.2 පදනම් කරගෙන ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර ඇඳීම සඳහා භාවිත වස්තු විෂය හා අරමුණු නම් කිරීම.
- එම සිතුවම්වල වර්ණ, රේඛා, හැඩතල හා ශිල්ප ක්‍රම පැහැදිලි කිරීම.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල දැකිය හැකි වෙනත් සුවිශේෂතා නම් කිරීම.
- ප්‍රාග් ඓතිහාසික මානවයාගේ කලා කුසලතාව හා දෛනික ජීවිත තොරතුරු ලියා දැක්වීම.

**ඇමුණුම 7.3.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 7.3.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කරන්න.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල පවතින සුවිශේෂ ලක්ෂණ හඳුනාගන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ප්‍රාග් ඓතිහාසික චිත්‍ර පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
    - කාලය
    - හමු වන ස්ථාන
    - වස්තු විෂය
    - ශිල්ප ක්‍රම
    - චිත්‍රවලින් හඳුනා ගත හැකි ප්‍රාග් මානවයාගේ ජීවිත තොරතුරු

2. එක් එක් ගුහා සිතුවම් පිළිබඳ විස්තරයක් කරන්න.
    - ස්ථානය
    - කාලය
    - වස්තු විෂය
    - මාධ්‍ය හා ශිල්ප ක්‍රම
    - ශෛලීය ලක්ෂණය (රූපවල ස්වභාවය)
    - සම්පිණ්ඩන ලක්ෂණ

- ඔබගේ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

## කියවීම් පත්‍රිකාව

## යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර

- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර ක්‍රිස්තු පූර්ව 40,000- ක්‍රිස්තු පූර්ව 10,000ත් අතර කාලයට අයත් යැයි සැලකේ.
- ගුහා තුළ ජීවත් වූ ආදි මානවයන් එදිනෙදා ජීවිතයේ ලැබූ අත්දැකීම් ගුහා බිත්ති මත සිතුවම් කොට තිබේ. මේවා අතර සත්ත්ව රූප, මානව රූප, ජ්‍යාමිතික හැඩතල, සහ විවිධ සංකේත ද වේ.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර ඇති ස්ථාන අතරින් ප්‍රංශයේ ලැස්කෝ, ස්පාඤ්ඤයේ ඇල්ටමයිරා ගුහාව, ෆොන්ඩිගෝම් ගුහාව, කොගුල් ගුහාව ප්‍රධාන තැනක් ගනී.
- මෙම චිත්‍ර නිර්මාණ කිරීම සඳහා ශිල්ප ක්‍රම කිහිපයක් භාවිත කොට තිබේ. එම ශිල්ප ක්‍රම අනුව ප්‍රාග් ඓතිහාසික සිතුවම් ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්විය හැකි ය.
  - රේඛා චිත්‍ර - (Line drawing)
  - වර්ණ සිතුවම් - (Painting)
  - ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප (Engraving)
  - අත් සලකුණු - (Hand prints)
- චිත්‍ර වර්ණ ගැන්වීම සඳහා පරිසරයෙන් සොයාගත් ස්වාභාවික ද්‍රව්‍ය වන අඟුරු, කිරිමැටි, සත්ත්ව ලේ, හිරිගල්, පස් යනාදිය භාවිත කර ඇති අතර ඒවා ජලය, මැලියම් නැතහොත් සත්ත්ව ලේ සමඟ මිශ්‍ර කර ඇත.
- එමෙන් ම මෙම චිත්‍ර සඳහා කළු, අඳුරු රතු, දුඹුරු, අළු, සුදු යන වර්ණ බහුල ලෙස භාවිත කොට තිබේ.

## ඇල්ටමීරා ගුහා චිත්‍ර






- ඇල්ටමීරා ගුහා චිත්‍ර ස්පාඤ්ඤයට අයත් ය.
- මෙහි ඇති සිතුවම් ක්‍රිස්තු පූර්ව 15.000- 10.000ට පමණ අයත් යැයි සැලකේ.
- මෙම ගුහාවේ රේඛා චිත්‍ර, වර්ණ සිතුවම්, ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප සහ අත් සලකුණු වශයෙන් ශිල්ප ක්‍රම කිහිපයක ම නිර්මාණ දැකිය හැකි ය.
- මෙහි ඇති චිත්‍ර අතර බයිසන් රූප, අශ්ව රූප, පිනිමුවන් සහ වල් ඌරන් ගේ රූප සහ විවිධ සංකේත සහ ජ්‍යාමිතික හැඩතල ද වේ.
- මේවා සියල්ල රතු, දුඹුරු, කළු සහ සුදු යන වර්ණවලින් වර්ණ කොට තිබෙන අතර ඇතැම් සිතුවම් සඳහා කළු පැහැති බාහිර රේඛාවක් යොදා තිබේ.

## ලැස්කෝ ගුහා චිත්‍ර









- ප්‍රංශයේ මොන්ටිනැක් නුවර අසල ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් සඳහා ප්‍රසිද්ධියක් උසුලන ලැස්කෝ (Laxcaus) ගුහා පිහිටා ඇත.
- මෙහි ඇති සිතුවම් ක්‍රිස්තු පූර්ව 15.000 -13.000 අතර කාලයට අයත් යැයි සැලකේ.
- මෙම ගුහාවේ රේඛා චිත්‍ර, වර්ණ සිතුවම්, ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප, අත් සලකුණු ආදි ශිල්ප ක්‍රම කිහිපයක ම නිර්මාණ දැකිය හැකි ය.
- මෙහි ඇති චිත්‍ර අතර සත්ත්ව රූප, මානව රූප සහ විවිධ සංකේත සහ ජ්‍යාමිතික හැඩතල ද වේ. මේ අතර බයිසන් රූපය විශාල වශයෙන් ඇඳ තිබේ.
- ලැස්කෝ ගුහාවේ චිත්‍ර අතර අඩි 17ක් දිග බයිසන් ගව රූපය විශිෂ්ට නිර්මාණයක් ලෙස සැලකේ.
- ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන් ගේ රුව සහ බිම වැතිරී සිටින මිනිසකුගේ රුව සහිත චිත්‍රය ( Hunting Scene) මෙම ගුහාවේ ඇති වැදගත් චිත්‍රයක් ලෙස සැලකේ.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.4** : **දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල එන සත්ත්ව රූප අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.4.1** : **සාම්ප්‍රදායික සත්ත්ව රූප අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : **04 යි.**

**ගුණාත්මක යෙදවුම්** :
- දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූ සටහන් සහ ඡායාරූප, එම නිර්මාණ ඇතුළත් වීඩියෝ පට
- පරිගණක යන්ත්‍ර
- ඇමුණුම 7.4.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා පිටපත්
- ඇමුණුම 7.4.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා අවශ්‍ය පමණ

**ඉගෙනුම් පල** :
- දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූප නම් කරයි.
- දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූප නිර්මාණශීලී ව ස්වනිර්මාණ කාර්යයේ දී භාවිත කරයි.
- සත්ත්ව රූප සැරසිලිවල නිර්මාණාත්මක බව, ශෛලිගත බව හා කලාත්මක ලක්ෂණ අගය කරයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 7.4.1.1** :
- දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූප සටහන් සහ ඡායාරූප පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණ ඇතුළත් වීඩියෝ දර්ශන පරිගණකය ඇසුරින් ප්‍රදර්ශනය කරන්න.
- දේශීය සාම්ප්‍රදායික සත්ත්ව රූප යොදා ගනිමින් කරන ලැබූ විවිධ නිර්මාණ හඳුන්වා දෙමින් සාකච්ඡාවක නිරත වෙන්න.

(මිනිත්තු 10 යි)

**පියවර 7.4.1.2** :
- ඇමුණුම 7.4.1.1ට ඇතුළත් කාර්ය පත්‍රිකා පිටපත් සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුම 7.4.1.2ට ඇතුළත් කියවීම් පත්‍රිකා සිසුන්ට බෙදා දෙන්න.
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ක්‍රියාකාරකමේ යොදවන්න.
- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 130 යි)

**පියවර 7.4.1.3** :
- අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව ලබාදෙන්න.
- ඒවායේ නිවැරදි භාවය සාකච්ඡා කරන්න.
- එම සාකච්ඡාව අතරතුර අනෙක් සිසුන්ට තම අනාවරණ වැරදි නිවැරදි කර ගැනීමට හා අනෙකුත් කණ්ඩායම්වල අනාවරණ සටහන් කර ගැනීමට උපදෙස් ලබාදෙන්න.

(මිනිත්තු 20 යි)

**ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ඇමුණුම 7.4.1.1 සහ ඇමුණුම 7.4.1.2 පදනම් කරගෙන ඇගයීමේ සහ තක්සේරුකරණ ක්‍රියාවලියේ යෙදෙන්න.

- දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූප නම් කිරීම.
- දේශීය සාම්ප්‍රදායික සත්ත්ව රූප යොදා ගනිමින් කරනු ලැබූ විවිධ නිර්මාණ හා මාධ්‍ය හඳුනාගෙන විස්තර කිරීම.
- එම සත්ත්ව රූප සැරසිලිවල නිර්මාණාත්මක බව, ශෛලිගත බව හා කලාත්මක ලක්ෂණ අගය කිරීම.

ඇමුණුම **7.4.1.1**

## කාර්ය පත්‍රිකාව

- ඇමුණුම 7.4.1.1ට ඇතුළත් කියවීම් පත්‍රිකාවේ රූප සටහන් අධ්‍යයනය කරන්න.

- ඔබ කණ්ඩායමට අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

  **i. කණ්ඩායම** - දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූපවල ලැයිස්තුවක් සකස් කරන්න.

  **ii. . කණ්ඩායම** - දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල ඇතුළත් සත්ත්ව රූප යොදා ගනිමින් කරනු ලැබූ නිර්මාණ හා ඒ සඳහා යොදා ගන්නා මාධ්‍ය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

  **iii. කණ්ඩායම** - දේශීය සාම්ප්‍රදායික සැරසිලිවල දැකගත හැකි සත්ත්ව රූපවල නිර්මාණාත්මක බව, ශෛලිගත බව හා කලාත්මක ලක්ෂණ අගයන්න.

- කණ්ඩායමට අදාළ ක්‍රියාකාරකමින් පසුව සෑම සිසුවෙක් ම කියවීම් පත්‍රිකාවේ දක්වන සත්ත්ව රූප පිටපත් කරගන්න.
- ගුරුතුමාගේ / ගුරුතුමියගේ සහාය ලබාගන්න.
- අනාවරණ ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්න.

.

ඇමුණුම 7.4.1.2

# කියවීම් පත්‍රිකාව

**දේශීය සාම්ප්‍රදායික සත්ත්ව රූප හා ඒවායේ භාවිතය -**

- **හංසයා** - සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ගල් කැටයම්, ඇත් දත් කැටයම්, රන්, රිදී, පිත්තල භාණ්ඩ සහ ආභරණ, පුස්කොළ පොත් කම්බ, වඩිම්බු උළු කැට
- **හංස පූට්ටුව** - සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ඇත් දත් කැටයම්, රන්, රිදී, පිත්තල භාණ්ඩ සහ ආභරණ, පුස්කොළ පොත් කම්බ
- **සිවු හංස පූට්ටුව** - සාම්ප්‍රදායික බිතු සිතුවම් (මහනුවර දළදා මාළිගාවේ පල්ලේ මාලයේ සිවිලිම් චිත්‍ර)
- **සිංහයා** - සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ගල් කැටයම්, වඩිම්බු උළුකැට, රන්, රිදී සහ පිත්තල භාණ්ඩ
- **ඇතා, අශ්වයා, ගවයා, ගිරවා, මොනරා, නාගයා** සාම්ප්‍රදායික බිතු සිතුවම්, ගල් කැටයම්, ලී කැටයම් සහ පිත්තල ආදි
- **යාලි** ලී කැටයම්, ගල් කැටයම්

- **ඇත්කඳ ලිහිණියා, භේරුණ්ඩ පක්ෂියා, ගජසිංහ, සරපෙන්දියා** -සාම්ප්‍රදායික බිතු සිතුවම්, ලී කැටයම්, ගල් කැටයම් සහ පිත්තල භාණ්ඩ ආදි

**සත්ත්ව රූප සැරසිලි ඒකකවල දැකිය හැකි විශේෂ ලක්ෂණ**

- සෑම සත්ත්ව රූප සැරසිලි ඒකකයක් ම ස්වාභාවික සත්ත්ව රූප එකක් හෝ කිහිපයක් හෝ යොදා ගෙන ශෛලිගත ආකාරයට මෝස්තරානුකූල ව නිර්මාණය කොට තිබීම.
- යොදාගනු ලබන මාධ්‍යයට හා කලා කෘතියේ ස්වභාවයට සහ තලයට උචිත ආකාරයට රූපය සම්පිණ්ඩනය කර තිබීම.

**සත්ත්ව රූප සැරසිලි සුලබ ව දැකිය හැකි ස්ථාන**

- **ලී කැටයම්** - ඇම්බැක්ක දේවාලය, හින්දු කෝවිල්
- **බිතු සිතුවම්** - මහනුවර දළදා මාළිගාව, හින්දු කොවිල්
- **රන්, රිදී සහ පිත්තල කැටයම්** - මහනුවර සහ කොළඹ ජාතික කෞතුකාගාරය ආදී ස්ථාන
- **පුස්කොළ පොත් කම්බ සිතුවම්** - කොළඹ ජාතික කෞතුකාගාරය ආදී ස්ථාන



**හංසයා**




**හංස පූට්ටුව**



**සිවු හංස පූට්ටුව**



සිංහයා




සිංහම්




ගවයා




අශ්වයා




ඇතා




ගිරවා




මොනරා




නාගයා




යාලි




ගජසිංහ



ඇත්කඳ ලිහිණියා



සරපෙන්දියා



හේරුණ්ඩ පක්ෂියා

## 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා වාර විභාග ප්‍රශ්න පත්‍ර සැකසීමේ ආකෘතිය

| ශ්‍රේණිය | ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව | ප්‍රශ්න සංඛ්‍යාව | උපදෙස් | කාලය |
|---|---|---|---|---|
| 6 | I | I කොටස ප්‍රශ්න 20 | • බහුවරණ ප්‍රශ්න 20 | පැය 02 |
| | | II කොටස ප්‍රශ්න 07 | • චිත්‍ර සංරචනය, මෝස්තර, ග්‍රැෆික්, හා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රශ්න 7ක්<br>• ද්‍රව්‍ය බලා ඇඳීම පැන්සල් චිත්‍රයක් අනිවාර්ය ප්‍රශ්නයක් ඇතුළත් කරන්නේ නම් වඩාත් සුදුසු ය. | |
| 7 | I | I කොටස ප්‍රශ්න 30 | - එම - | පැය 02 |
| | | II කොටස ප්‍රශ්න 07 | - එම - | |
| 8 | I | I කොටස ප්‍රශ්න 30 | - එම - | පැය 02 |
| | | II කොටස ප්‍රශ්න 07 | - එම - | |
| 9 | I | ප්‍රශ්න 40 | • බහුවරණ ප්‍රශ්න 40 | පැය 01 |
| | II | I කොටස ප්‍රශ්න 01 | • ද්‍රව්‍ය බලා ඇඳීම | පැය 1/2 |
| | | 11 කොටස ප්‍රශ්න 06 | • චිත්‍ර සංරචනය, මෝස්තර හා ග්‍රැෆික් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි | පැය 1 1/2 |
| 10 | I | ප්‍රශ්න 40 | • බහුවරණ ප්‍රශ්න 40 | පැය 01 |
| | II | ප්‍රශ්න 01 | • ද්‍රව්‍ය බලා ඇඳීම | පැය 02 |
| | III | ප්‍රශ්න 09 | • චිත්‍ර සංරචනය, මෝස්තර, ග්‍රැෆික්, හා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි | පැය 02 |
| 11 | I | ප්‍රශ්න 40 | • බහුවරණ ප්‍රශ්න 40 | පැය 01 |
| | II | ප්‍රශ්න 01 | • ද්‍රව්‍ය බලා ඇඳීම | පැය 02 |
| | III | ප්‍රශ්න 09 | • චිත්‍ර සංරචනය, මෝස්තර, ග්‍රැෆික්, හා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි | පැය 02 |